ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා

SLAASM3

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

2022

වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මඟින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. (60 පිටුව බලන්න)

පටුන

මණ්ඩලයේ සාමාජිකයන්.....01
මණ්ඩලයේ සාමාජිකයන් 2022 දෙසැම්බර් 31 දිනට.....02
මණ්ඩලයේ නිරීක්ෂකයින් / ආරාධිතයන් 2022 දෙසැම්බර් 31 දිනට.....06
2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය මගින් පත් කළ උප කමිටු.....07
මණ්ඩලයේ කාර්ය මණ්ඩලය - 2022 දෙසැම්බර් 31 දිනට.....08
මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය - 2022 දෙසැම්බර් 31 දිනට.....09
ක්‍රියාකාරකම් වාර්තාව - 2022.....10
2022 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්.....18
2022 වර්ෂය තුළ දී ලබා ගත් එකඟතා සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්.....22
2022 වර්ෂයේ විගණන පරීක්ෂණ වල සොයා ගැනීම්.....24
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සම්ක්ෂණ මණ්ඩලයෙහි කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර.....28
කාර්ය සාධන ලකුණු පත.....30
2022 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල ව මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBES).....32
2022 වර්ෂයේදී සමාලෝචනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට නිරීක්ෂණ අනුකූලව මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ, නිරීක්ෂණ සහිත බැවින් උපකාරක ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBEs).....37
2022 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන.....40
2022 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සිදු කරන ලද ප්‍රමිති සකස් කිරීම හා බැදුණු ක්‍රියාකාරකම්.....41
විගණකාධිපති වාර්තාව.....43
2022 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය.....47
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.....49
මූල්‍ය කාර්යසාධනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.....50
ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය.....51
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....52
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්.....53
නිශ්චිත ව්‍යාපාරික ව්‍යයවසායන්.....60

වාර්ෂික වාර්තාව - 2022

මණ්ඩලයේ සාමාජිකයන්

ජේ පී ආර් කරුණාරත්න *FCMA (UK), ACMA (SL) B.Sc. (Hons.) Maths and Stat. (Col.), PGDip in Applied Stat. (Col.), MCom. (Aus.)* සහකාර අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව	සභාපති (2022 පෙබ 18 දින සිට 2022 ජූනි 5 දින දක්වා)	
කේ එම් ඒ එන් දුවුලාගල මිය *FCMA (UK), MBA (USJP) MSc in Financial and Business Economics (Essex)* නියෝජ්‍ය අධිපතිනිය - ශ්‍රී ලංකා මහ බැංකුව	සභාපතිනිය (2022 ජූනි 06 සිට)	
එස් දිසානායක *LLM,* නීතිඥ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්	නිල බලයෙන් සාමාජික	
එච් එම් ඩබ් සී බණ්ඩාර *B.Com (Sp.), LLB,* නීතිඥ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්	නිල බලයෙන් (2022 මැයි 08 දින දක්වා)	
ඩී ආර් එස් හපුආරච්චි *Masters in Taxation Policy and Management (Keio) B.Com Sp. (Col.), Dip. in Prof. Diplomacy and World Affairs (SL)*	(2022 මැයි 09 දින සිට)	
සී මෙන්ඩිස් නීතිඥ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	නිල බලයෙන්	
ඩබ් ඩබ් ජේ සී පෙරේරා *FCA, FCMA, B.Sc B. Admin (USJP), CFE* හවුල්කරු-කේ.පී.එම්.ජ	පත් කළ සාමාජික	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී.ල.ව.ග.ආ)
එච් එම් ඒ ජයසිංහ *FCA, FCMA, CIPFA* ආසන්නතම හිටපු සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, දේශීය කළමනාකරණ හවුල්කරු - ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ අර්නස්ට් ඇන්ඩ් යංග්	පත් කළ සාමාජික	ශ්‍රී.ල.ව.ග.ආ
එස් එම් එස් එස් බණ්ඩාර *FCA, MBA (Col.), B.Sc (Acc. and Fin. Management) (USJP)* සභාපති - ශ්‍රී ල.ව.ග.ආ, හවුල්කරු - බී ආර් ද සිල්වා ඇන්ඩ් කම්පැණි	පත් කළ සාමාජික	ශ්‍රී.ල.ව.ග.ආ
පී ආර් ඒ අයි ගුණරත්න *ACMA (UK), CGMA, ACCA Affiliate, Dip.in Banking and Fin., B.Sc. Eng. (Hons), MBA (UK)* අධ්‍යක්ෂ - වේක්අප් සෝන් (පෞද්) සමාගම	පත් කළ සාමාජික	වික්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා අංශය
ආර් ටී අමරසූරිය *LLB (Hons.) (Col.), FCMA (UK), FCMA (SL), CGMA, Raisina Fellow, Attorney-at-Law* ආසන්නතම හිටපු ලේකම් - ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හිටපු කොමිෂන් සභා සාමාජික, *LAWASIA* හි විධායක කමිටු සාමාජික	පත් කළ සාමාජික	ශ්‍රී ලංකා නීතිඥ සංගමය
පී ඩී සමරසිංහ *FCA, FCMA (UK), MBA* සමූහ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී - ඔවර්සීස් රියැල්ටි (සිලෝන්) පී එල් සී	පත් කළ සාමාජික (2022 ජනවාරි 31 දක්වා)	ලංකා වාණිජ මණ්ඩලය
එම් පී අබේසේකර මිය *FCMA (UK), CGMA, FCA, B.Sc (Hons.) (Col.), MBA (Col.), GSLID* ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - කප්රුක හෝල්ඩිංග්ස් පීඑල්සී	(2022 මාර්තු 31 දින සිට)	
කේ කේ එස් ගුණවර්ධන *BA (Hons.) Econ. Sp., Dip.in Hypermedia Eng. (Col.), Dip.in Multimedia Technology (Col.), PGDip in Busi. and Fin. - ICA (SL)* කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී - ග්‍රැෆික් සිස්ටම්ස් (පෞද්) සමාගම	පත් කළ සාමාජික	ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය
ඩබ් පී ආර් පී එච් ෆොන්සේකා *FCA, SFIBs (SL), B.Sc Busi. Admin (Hons.) (USJP), PGDip in Mgmt. (PIM), MBA (Ausi.)* අතිරේක සාමාන්‍යාධිකාරී / ප්‍රධාන මූල්‍ය නිලධාරී - ලංකා බැංකුව	පත් කළ සාමාජික (2022 මාර්තු 31 දින සිට)	ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය
මහාචාර්ය ඒ ජයමහ *FCA, PhD (USQ-Aus.), M.Com (UoK), B.Com(UoK)* පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය	පත් කළ සාමාජික	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
එම් ඩී පී එල් පෙරේරා මිය *FCA, MBA (Col.)*	මණ්ඩල ලේකම්	

මණ්ඩලයේ සාමාජිකයන්

2022 දෙසැම්බර් 31 දිනට



කේ එම් ඒ එන් දවුලාගල මිය
FCMA (UK), MBA (USJP), MSc in Financial and Business Economics University of Essex UK

මණ්ඩලයේ සභාපතිනිය වශයෙන් කටයුතු කරන දවුලාගල මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිනියකි. ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය, විගණන, සංචිත කළමනාකරණ, නියාමන සහ අධීක්ෂණ, සාර්ව විචක්ෂණශීලිතා අධ්‍යයන, මානව සම්පත් කළමනාකරණ සහ අවදානම් කළමනාකරණ යන ක්ෂේත්‍රවලට අයත් විවිධ තනතුරුවල වසර 31 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇත.



ඩී ආර් එස් හපුආරච්චි
Masters in Taxation Policy and Management (Keio) B.Com (Sp) (Col), Dip. in Professional Diplomacy and World Affairs (SL)

හපුආරච්චි මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) සේවය කර වසර 35කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇති අතර ලියාපදිංචිය, තක්සේරු කිරීම සහ එකතු කිරීම, බදු ප්‍රතිපත්තිය සහ ජාත්‍යන්තර කටයුතු, අර්ථ නිරූපණ සහ පැහැදිලි කිරීම් ඇතුළු බදු අනුකූලතා ක්‍රියාවලියට අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලබා ඇත.

ඔහු 2002 - 2005 කාලපරිච්ඡේදය තුළ විදේශීය විශ්වවිද්‍යාල සඳහා බදුකරණය පිළිබඳ පර්යේෂණ පත්‍රිකා රාශියක් ප්‍රකාශයට පත් කර තිබේ. තවද බොහෝ සම්මාන ලබා ඇති හපුආරච්චි මහතා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී ලබා ගත් ඉහළ පෙළේ ජයග්‍රහණ වෙනුවෙන් ගෞරව පිරිනැමීම් ද ලබාගෙන තිබේ.



එස් දිසානායක
LLM, නීතිඥ

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වන දිසානායක මහතා ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරී භාර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් වර්තමානයේ ඔහුව නිදහස් කර ඇත.

දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන අංශ දෙකෙහිම පළපුරුද්ද ලබාගෙන ඇති අතර 2010-2011 කාලපරිච්ඡේදය තුළ දූෂණයට එරෙහි ෆීජී ස්වාධීන කොමිෂන් සභාවේ අභිචෝදකවරයෙකු ලෙස ද සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) කොමසාරිස්වරයෙකු ලෙස ද සේවය කරයි.



සී මෙන්ඩිස්
නීතිඥ

මෙන්ඩිස් මහතා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරයි.

මණ්ඩලයේ සාමාජිකයන්
2022 දෙසැම්බර් 31 දිනට



ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා
FCA, FCMA, B.Sc. Business Administration (USJP), CFE

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හිටපු සභාපතිවරයකු වන පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ කේපීඑම්ජී ආයතනයේ හවුල්කරුවකු වේ. ඔහු කේපීඑම්ජී ආයතනයේ අවදානම් උපදේශන සහ වෝහාරික සේවා අංශයේ ප්‍රධානියා වන අතර ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමය මගින් පිළිගත් සහතිකලත් වංචා විමර්ශකයක වේ.



එච් එම් ඒ ජයසිංහ
FCA, FCMA, CIPFA

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයා වන ජයසිංහ මහතා ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ ආර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ දේශීය කළමනාකරණ හවුල්කරුවකු වේ. ඔහු ආර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ බැංකුකරණ සහ මූල්‍ය සේවා පරිච භාර සහතික කිරීමේ ප්‍රධානියා ද වේ.

ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ වසර 40 ක පෘථුල පළපුරුද්දක් ලබා ඇති ජයසිංහ මහතා, දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි. ඔහු වෙනත් ව්‍යවස්ථාපිත ආයතන, වෘත්තීය සංගම් සහ අධ්‍යාපන ආයතන බොහොමයක සාමාජිකයෙකු වශයෙන් ද සේවය කරයි. ජයසිංහ මහතා ලැයිස්තුගත සමාගම් කිහිපයක විගණන කමිටුවල උපදේශකවරයකු වශයෙන් ද කටයුතු කරයි.



එස් එම් එස් එස් බණ්ඩාර
FCA, MBA (Colombo), B.Sc Accountancy and Financial Management (USJP)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා වන බණ්ඩාර මහතා, වරලත් ගණකාධිකාරීන් වන බී ආර් ද සිල්වා සහ සමාගමේ හවුල්කරුවකු වන අතර ඔහු විගණන සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශේෂඥයකු වශයෙන් කටයුතු කරමින් වසර 24කට අධික ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබේ.

ඔහු ආසියා ශාන්තිකර ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සහ දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) මණ්ඩල සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි. තවද, ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ද වේ.



පී ආර් ඒ අයි ගුණරත්න
ACMA (UK,) CGMA, ACCA Affiliate, Diploma in Banking and Finance, B.Sc. Engineering (Hons), MBA (UK)

වේක් අප් සෝන් (පෞද්) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන ගුණරත්න මහතා ගිණුම්කරණ සහ මූල්‍ය ක්ෂේත්‍රවල වසර 11 කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත. මීට පෙර ඔහු ඊසස් වින්ර්පි පොදු සමාගම, බ්‍රැන්ඩික්ස් සමාගම් සමූහයේ සහ කේපීඑම්ජී ආයතනයේ මූල්‍ය ප්‍රධානියා ලෙස සේවය කර ඇත. ඔහු ජාත්‍යන්තර සහතිකලත් වෘත්තීය ගණකාධිකාරීන්ගේ සංගමයේ මැදපෙරදිග, දකුණු ආසියානු සහ උතුරු අප්‍රිකානු කලාපීය උපදේශක මණ්ඩලවල සාමාජිකයෙකු වන අතර සීඅයිඑම්ඒ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වශයෙන් ද කටයුතු කරයි. ගුණරත්න මහතා ශ්‍රී ලංකාව, මියන්මාරය, වියට්නාමය, නයිජීරියාව සහ ආසියා ශාන්තිකර කලාපය ඇතුළු විවිධ භූගෝලීය කලාපවල සීඅයිඑම්ඒ ආයතනයේ දේශන පවත්වා ඇත.

මණ්ඩලයේ සාමාජිකයන්

2022 දෙසැම්බර් 31 දිනට



ආර් ටී අමරසූරිය

LL.B (Hons.) (Col), FCMA (UK), FCMA (SL), CGMA, Raisina Fellow, Attorney-at-Law

අමරසූරිය මහතා අභියාචන නීතියේ මෙන්ම ව්‍යවස්ථාපිත සහ පොදු නීතියේ සියලු අංශවල විශේෂඥයකු වශයෙන් කටයුතු කරමින්, ශ්‍රී ලංකාවේ අභියාචන අධිකරණවල නිත්‍ය වෘත්තිකයෙකු වශයෙන් කටයුතු කරන අතර සිවිල්, ගිවිසුම්, වාණිජ, දේපළ, බදුකරණය, බැංකුකරණය, කම්කරු යන විවිධාංගිකරණය වූ ක්ෂේත්‍ර සහ විෂයයන්වල සහ නීතියේ අනෙකුත් ක්ෂේත්‍රවල විවිධ පරිචයන් ලබා ඇත.

අමරසූරිය මහතා 2013 වසරේ දී වයස අවුරුදු 40 ට අඩු ශ්‍රී ලංකාවේ වඩාත් කැපීපෙනෙන සීඅයිඑම්ඒ සාමාජිකයා වශයෙන් වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA) මගින් පිරිනමන ලද සීඅයිඑම්ඒ කීර්තිමත් තරු රන් සම්මානයෙන් පිදුම් ලැබූ අතර 2021 වර්ෂයේ දී ද, LMD - CIMA පුරෝගාමියකු ලෙස ද නම් කරන ලදී.

අමරසූරිය මහතා ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ ආසන්නතම හිටපු ලේකම් වශයෙන් කටයුතු කළ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සභාපති ලෙසද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අධ්‍යයනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයකු වශයෙන් ද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ නීති පීඨයේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සහ ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩල සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි. ඔහු ආසියා සහ ශාන්තිකර නීති සංගමයේ (LAWASIA) විධායක කමිටු සාමාජිකයකු ද වේ.

ඔහු ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) හිටපු කොමිෂන් සභා සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා නීති අධ්‍යාපනය පිළිබඳ සංස්ථාපිත කවුන්සිලයේ හිටපු සාමාජිකයකු ද වේ.



මනෝහාරි අබේසේකර

FCMA (UK), CGMA, FCA, B.Sc (Hons.) (Col), MBA (Col), GSLID

කප්රුක හෝල්ඩිංග්ස් පීඑල්සීහි ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරියක වන අබේසේකර මහත්මිය මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 20කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත. මීට පෙර, ඇය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ හේලීස් සමූහයේ ඇතැම් අනුබද්ධිත ආයතනවල අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කළාය. ඇය හේලීස් පීඑල්සී හි උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධන ප්‍රධානියා ද විය.

අබේසේකර මහත්මිය දකුණු ආසියාව නියෝජනය කරමින් CIMA UK Global Council හි සාමාජිකාවක් ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකාවක් ද වේ. අබේසේකර මහත්මිය 2019 වර්ෂයේ දී Fortune US රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ගෝලීය කාන්තා උපදේශන වැඩසටහන සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර 2014 වර්ෂයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් කීර්තිමත් ජාත්‍යන්තර අමුත්තන්ගේ නායකත්ව වැඩසටහන (IVLP) සඳහා ද ඇයව තෝරා ගන්නා ලදී.

අබේසේකර මහත්මිය 2015 වර්ෂයේ දී ආයතනික කළමනාකරණය හැදෑරීම සඳහා ජපානයේ විදේශීය තාක්ෂණික සහයෝගිතාව සහ තිරසාර හවුල්කාරිත්වයන් සඳහා වූ සංගමය (AOTS) වෙතින් ශිෂ්‍යත්වයක් ලබා තිබේ. ඇය කාන්තා නායකත්වය පිළිබඳ සම්මාන ද ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ MBA වැඩසටහනට සහභාගී වී කණ්ඩායමේ විශිෂ්ටතමයා ලෙස ඉහළම සාමාර්ථයක් අත්පත් කරගෙන තිබේ.



කේ කේ එස් ගුණවර්ධන

BA (Hons.) Economics Sp., Dip.in Hypermedia Engineering (Col), Dip.in Multimedia Technology (Col), PGDip in Business and Finance - ICA (SL)

ග්‍රැපික් සිස්ටම්ස් (පෞද්) සමාගමේ සහ ග්‍රැපික් සිස්ටම්ස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගමේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ වන ගුණවර්ධන මහතා මුද්‍රණ කර්මාන්තය, තොරතුරු තාක්ෂණය, ගිණුම්කරණය සහ මූල්‍ය යන ක්ෂේත්‍රවල වසර 37කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත.

වර්තමානයේ ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ සභාපතිවරයා වන අතර ඔහු අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සහ ප්‍රවර්ධන උපදේශක කමිටුවේ සභාපතිවරයා ද වේ. එසේම ඔහු තවත් බොහෝ සමාගම් සහ සංගම්වල ද සේවය කරයි. ගුණවර්ධන මහතා 1999 සහ 2001 වර්ෂවල දී ශ්‍රී ලංකා ව්‍යවසායකයා යන සම්මානය ඇතුළුව සම්මාන රැසකින් පිදුම් ලබා තිබේ.

මණ්ඩලයේ සාමාජිකයන්

2022 දෙසැම්බර් 31 දිනට



ඩබ්ලිව් පී ආර් පී එච් ෆොන්සේකා

FCA, SFIBs(SL), B.Sc Business Administration (Hons.) (USJP), PGDip in Management (PIM), MBA (Ausi.)

ෆොන්සේකා මහතා 2012 වසරේ සිට ලංකා බැංකුවේ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලද අතර ඔහු වර්තමානයේ බැංකුවේ අතිරේක සාමාන්‍යාධිකාරිවරයා ලෙස කටයුතු කරයි. ඔහු බැංකුකරණය පිළිබඳව දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් වසර 32කට අධික පළපුරුද්දක් ලබාගෙන තිබෙන අතර සිල්ලර ණය දීම, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, ජාත්‍යන්තර මෙහෙයුම් සහ භාණ්ඩාගාර සහ ආයෝජන යන ක්ෂේත්‍රවල විශේෂඥ දැනුමක් ලබාගෙන තිබෙන අතර මූල්‍ය කළමනාකරණය, මූල්‍ය වාර්තාකරණය සහ බැංකුකරණ ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලසුම් පිළිබඳ විශේෂඥයෙකු වේ.

ෆොන්සේකා මහතා පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ බොහෝ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කරයි. එමෙන්ම ඔහු ඇතැම් සමාගම්වල විගණන කමිටු සභාපතිවරයා ලෙස ද වගකීම් දරයි.

ෆොන්සේකා මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ (AAT Sri Lanka) පාලක මණ්ඩලයේ ආසන්නතම හිටපු සභාපතිවරයා ද වේ.



මහාචාර්ය ඒ ජයමහ

FCA,PhD (USQ-Aus), M.Com (UoK), B.Com (UoK),

කැලණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යනාංශයේ ගණකාධිකරණය පිළිබඳ මහාචාර්යවරයා වන මහාචාර්ය ජයමහ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා ද වේ. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වසර 40කට අධික කාලයක් සේවය කර ඇති අතර එම විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශයේ සහ ගණකාධිකරණ අධ්‍යනාංශයේ ප්‍රධානියා වශයෙන් ද සේවය කර ඇත. එමෙන්ම, මහාචාර්ය ජයමහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති වැඩසටහනේ සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කර ඇත.

මහාචාර්ය ජයමහ මහතා 2010 වර්ෂයේ දී දර්ශනශූරී උපාධියෙන් ද පිදුම් ලැබීය. ඔහු ජයමහ පුෂ්පකුමාර සහ සමාගමේ වෘත්තිකයකු සහ පූර්වගාමී හවුල්කරුවෙකු ද වන අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ ආයතනික සමාලෝචනයේ සමාලෝචකයකු ලෙස ද සිය සේවය ඉටු කරයි. තවද, ඔහු 2020 වර්ෂයේ සිට එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරයි.

මණ්ඩලයේ නිරීක්ෂකයින් / ආරාධිතයින්

2022 දෙසැම්බර් 31 දිනට

සභාපති,
ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුව



ටී පේ එස් රාජකාරිය
FCA, FCCA, FCMA, CGMA

රාජකාරිය මහතා කේපීඑම්ජී ශ්‍රී ලංකා හි හවුල්කරුවෙකු වන අතර ඔහු පොදු ගිණුම්කරණ පරිචයේ වසර 36 කට අධික කාලයක් සේවයේ නිරතව සිටියි. වර්තමානයේ ඔහු කේපීඑම්ජී ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර කේපීඑම්ජී ආයතනයේ මැද පෙරදිග සහ දකුණු ආසියානු කලාපයේ මූල්‍ය සේවා ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි. ශ්‍රී ලංකාව සඳහා විගණන පරිචයේ ප්‍රධානියා ලෙස ද අඛණ්ඩව කටයුතු කරන රාජකාරිය මහතා ඕමානය, ඩුබායි, මාලදිවයින සහ ලන්ඩනය ආදී විදේශ රටවල සේවය කර පළපුරුද්ද ලබාගෙන ඇත. ඔහු 2018 - 2020 කාලපරිච්ඡේදය තුළ ACCA ශ්‍රී ලංකා හි සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත.

රාජකාරිය මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සාමාජිකයකු ද වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ තවත් කමිටු සහ අංශ කිහිපයක සේවය කරමින් ප්‍රතිපත්ති සැකසීමේ දී සහ මඟපෙන්වීම් ලබා දීමේ දී ක්‍රියාකාරීව දායක වී ඇත.

මණ්ඩලයේ නිරීක්ෂක,
භාණ්ඩාගාර නියෝජිත



ඩබ්ලිව් එච් ඒ විමලජීව
ACA, B.Sc. Accountancy (Sp.)(USJP), MBus (UoK)

රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඩබ්ලිව් එච් ඒ විමලජීව මෙනවිය රාජ්‍ය අංශයේ වසර 14කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත.

අධ්‍යක්ෂ ජනරාල්



ඒ අයි මොහොට්ටි
FCA, FCMA (UK), CGMA, BBA (Hons.) (Col), MBA (Leicester)

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) අධ්‍යක්ෂ ජනරාල්වරිය වන මොහොට්ටි මහත්මිය නියාමන සහ වාණිජ ක්ෂේත්‍රවලට අයත් විවිධ ව්‍යාපාර අංශවල මූල්‍ය හා ව්‍යාපාර කළමනාකරණය සහ විගණනය පිළිබඳව වසර 32කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත. ඇය එම කාලයෙන් වසර 22කට අධික කාලයක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතවලට අනුකූලතාව දැක්වීම හා සම්බන්ධ නියාමන කටයුතුවල නිරත වී තිබේ.

2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය මගින් පත් කළ උප කමිටු

2022 ජූලි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම පත් කිරීම් සිදු කර ඇත.

විගණන කමිටුව

එස් එම් එස් එස් බණ්ඩාර මයා - සභාපති
මහාචාර්ය වී ජයමහ - සාමාජික
ඩබ් එච් ඒ විමලජීව මිය - සාමාජික
එම් ධනපාල මයා - විගණකාධිපතිවරයාගේ නියෝජිත - නිරීක්ෂක
සාමාජික නොවන ලේකම් - එච් බී රසාක් මිය (අධ්‍යක්ෂ තාක්ෂණ)

පාරිශ්‍රමික කමිටුව

කේ එම් ඒ එන් දවුලාගල මිය - සභාපතිනි
එම් පී අබේසේකර මිය - සාමාජික
පී ආර් ඒ අයි ගුණරත්න මයා - සාමාජික
ආර් ටී අමරසූරිය මයා - සාමාජික
ඩබ් එච් ඒ විමලජීව මිය - සාමාජික
සාමාජික නොවන ලේකම් - ඒ අයි මොහොට්ටි මිය (අධ්‍යක්ෂ ජනරාල්)

තාක්ෂණ උප කමිටුව

එම් පී අබේසේකර මිය - සභාපති
ඩබ් පී ආර් පී එච් ෆොන්සේකා මයා - සාමාජික
එච් එම් ඒ ජයසිංහ මයා - සාමාජික
මහාචාර්ය වී ජයමහ - සාමාජික
සී මෙන්ඩිස් මයා - සාමාජික
සාමාජික නොවන ලේකම් - එම් එල් හේවගේ මිය (අධ්‍යක්ෂ තාක්ෂණ)

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව


පී ආර් ඒ අයි ගුණරත්න මයා - සභාපති
ඩබ් ඩබ් ජේ සී පෙරේරා මයා - සාමාජික
එස් දිසානායක මයා - සාමාජික
කේ කේ එස් ගුණවර්ධන මයා - සාමාජික
ඒ අයි මොහොට්ටි මිය (අධ්‍යක්ෂ ජනරාල්) - සාමාජික
සාමාජික නොවන ලේකම් - අයි ඊ ඉද්දමල්ගොඩ මිය (අධ්‍යක්ෂ තාක්ෂණ)

ගැටුම් විසඳීමේ කමිටුව

සී මෙන්ඩිස් මයා - සභාපති
එස් දිසානායක මයා - සාමාජික
ආර් ටී අමරසූරිය මයා - සාමාජික
ඩී ආර් එස් හපුආරච්චි මයා - සාමාජික
ඩබ් පී ආර් පී එච් ෆොන්සේකා මයා - සාමාජික
සාමාජික නොවන ලේකම් - ඒ අහමත් මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය - 2022 දෙසැම්බර් 31 දිනට





1. කේ සිවකුමාර්
2. ආශා අහමත් මිය
3. අනුෂා අයි මොහොට්ටි මිය
4. හෆ්සා බී රසාක් මිය
5. එම් ලක්මාලි හේවගේ මිය
6. හිරන්ති ජයවීර මිය
7. ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
8. කේ. රසික එස් බණ්ඩාර
9. දුමින්දා කේ ගුරුවත්ත මිය
10. එච් එස් යූ පී ජයවර්ධන
11. ඩී එම් නිලන්ති පී දන්දෙණි මිය
12. කලණී හෙට්ටිආරච්චි මිය
13. එෆ් ශිරෝමි අබේකෝන් මිය
14. දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය
15. එල් වත්සලා මල්ලවාරච්චි මිය

මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය - 2022 දෙසැම්බර් 31 දිනට

අනූෂා අයි මොහොට්ටි මිය
FCA, FCMA (UK), CGMA, BBA (Hons.)(Col),
MBA (Leicester)
අධ්‍යක්ෂ ජනරාල්

ආශා අහමත් මිය
FCA, MBA (Col)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

හෆ්සා බී රසාක් මිය
FCA, ACMA (UK), CGMA, MBA (USJP)
අධ්‍යක්ෂ තාක්ෂණික

එම් ලක්මාලි හේවගේ මිය
FCA, ACMA (UK), CGMA, MBA (USJP)
අධ්‍යක්ෂ තාක්ෂණික

ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
FCA, B.Sc Finance (Sp) (USJP)
අධ්‍යක්ෂ තාක්ෂණික

දිලිනිකා මෙන්මෙන්දඅාරච්චි මිය
FCA, ACCA, B.Sc Accounting Sp (Hons.) (USJP)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

එච් ඒ කලණී එස් හෙට්ටිආරච්චි මිය
FCA, B.Sc Accounting Sp (Hons.) (USJP)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

ඩී එම් නිලන්ති පී දන්දෙනි මිය
FCA, BBA Accounting Sp. (Hons.) (Col), AIB (SL)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

එල් වත්සලා මල්ලවාරච්චි මිය
FCA, B.Sc Accounting Sp. (Hons.) (USJP)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත යටතේ නියාමන ආයතනයක් වශයෙන් ස්ථාපනය කරන ලද අතර එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2000 වර්ෂයේ දී ආරම්භ විය. පනත මඟින් ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBE) ලෙස නිර්වචනය කරනු ලබන අතර (නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ (SBE) නිර්වචනය සඳහා 60 පිටුව බලන්න) එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සිය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLASs) අනුකූල විය යුතුය. මෙම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල විගණන කටයුතු සිදු කරන විට, ඔවුන්ගේ විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට හැකි වන පරිදි එකී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය විසින් විගණනය කරන ලද ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කළ යුතු බවට පනත මඟින් නියම කර ඇත.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණන කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීම, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මඟින් සිය කාර්යයන් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනත යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාශයට පත් කිරීම හෝ සම්මත කිරීම සිදු කරනු ලැබේ. එවැනි ප්‍රමිතීන් සම්මත කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සහාය වීම සඳහා පනත යටතේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් ස්ථාපනය කර ඇත. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) මඟින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති (IASs) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRSs) මත පදනම්ව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරනු ලබයි. එසේම අනුගමනය කරන ලද විගණන ප්‍රමිතීන් ජාත්‍යන්තර විගණන සහ තහවුරු කිරීමේ ප්‍රමිති මණ්ඩලය (IAASB) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) මත පදනම් වේ. මේ වන විට වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එකී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රමිති 42ක් සහ විගණන ප්‍රමිති 38ක් සම්මත කර ඇත.

2. පශ්චාත් කොවිඩ් 19 අවධියේ නිවසේ සිට වැඩ කිරීමේ වැඩපිළිවෙළ මඟින් නියාමන ක්‍රියාකාරකම්වලට ඇති වූ බලපෑම

සෞඛ්‍ය බලධාරීන් විසින් පනවන ලද කොවිඩ් 19 වසංගත පාලන ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති වූ තොරතුරු ප්‍රවාහයේ සීමා කිරීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර අවසන් කිරීමේ දී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණන කටයුතු සම්පූර්ණ කිරීමේ දී විගණකවරුන් විසින් මුහුණ දුන් අභියෝග ප්‍රවර්තන වර්ෂය තුළ දී ද වඩාත් අඩු වසංගත පාලන ක්‍රියාමාර්ග යටතේ වුවද අඛණ්ඩව පැවතුනි. මේ අතර, වර්ෂය තුළ දක්නට ලැබුණු විදුලිබල හා බලශක්ති හිඟය හේතුවෙන් රාජකාරී කටයුතු සිදු කිරීම සඳහා භෞතික වාර්තාකරණය සීමා කිරීම සහ 2021 කොවිඩ් 19 පාලන කාලසීමාවට සමානව, පවතින තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව භාවිතා කිරීමට කාර්ය මණ්ඩලයට හැකි වන පරිදි වැඩ වාර සටහන් මත පදනම්ව රාජකාරී කටයුතු ඉටු කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හැකිතාක් දුරට නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මූල්‍ය ප්‍රකාශනවල විද්‍යුත් පිටපත් භාර ගැනීමට කටයුතු කළ අතර අතථ්‍ය වේදිකා (Virtual Platforms) හරහා හෝ භෞතිකව විගණන පරීක්ෂා කිරීම සිදු කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, වාර්තා කරා ප්‍රවේශ වීම, ලිපි සකස් කිරීම, තාක්ෂණික සාකච්ඡා පැවැත්වීම, වාර්තා යාවත්කාලීන කිරීම, විගණන පරීක්ෂණ පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සමඟ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් විද්‍යුත් මාධ්‍යයක් හරහා කාර්ය මණ්ඩලය සමාලෝචන කටයුතු කරා ප්‍රවේශ වීමත් සමඟ මෙම නව අවස්ථාවලින් උපරිම ප්‍රතිඵල ලබා ගන්නා ලදී.

එමෙන්ම, සෑමවිටම කාර්ය මණ්ඩලයේ සහ පාර්ශවකරුවන්ගේ සුබසාධනය ඇති කිරීම සහතික කරමින් තාක්ෂණික දියුණුවේ උපරිම දායකත්වය ලබා ගනිමින් කාර්ය මණ්ඩලයේ ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් ද අතථ්‍ය සැසි හරහා පවත්වන ලදී. මෙම පියවර අනුගමනය කිරීම මඟින් කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතුවල අඛණ්ඩ කාර්යසාධනය තහවුරු කළ අතර එමඟින්, ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස මණ්ඩලයේ වාර්ෂික සැලසුම් සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එහි ව්‍යවස්ථාපිත කාර්යයන් සිදුකිරීම සඳහා වසර තුළ ඉටු කරන ලද ප්‍රධාන මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

3. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

3.1. සමාලෝචන සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බවට වග බලා ගැනීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල හඳුනාගැනීම් සහ ඇගයීමේ අවශ්‍යතා මෙන්ම ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ප්‍රමිතීන්ට අනුකූල නොවීම් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ට අනාවරණය වූ අවස්ථාවල අනුකූල නොවීමෙහි පවතින ප්‍රමාණවත් බව මත පදනම්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රමිතීන්ට ප්‍රමාණාත්මකව අනුකූල නොවීම සම්බන්ධව අවධානය යොමු කිරීමට තරම් හේතුවක් නිරීක්ෂණය නොවුවහොත්, එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ලෙස සලකනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වන නමුත්, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිතා කිරීමට තරම් අවශ්‍ය නොවන ගැටලු හඳුනාගෙන ඇති අවස්ථාවල, එම මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණවලට අනුකූල යැයි සලකනු ලබන අතර අනාගතයේ දී අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා මෙම සොයා ගැනීම් ආධාර ලිපියක් ආකාරයෙන් අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත දැනුම් දෙනු ලැබේ.

ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය ප්‍රමාණාත්මකව වෙනස් කරන අවස්ථා වලදී, නිකුත් කිරීමට නියමිත මීළඟ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙතින් විකඟවීමක් අපේක්ෂා කරයි. මෙම ක්‍රියාවලියේදී, අපේක්ෂා කළ හැකි වැඩිදියුණු කිරීම් නොමැතිව අනුකූල

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

නොවීම නැවත නැවත සිදුවන ස්වභාවයක් ඇති අවස්ථාවල දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත අනුකූල නොවීම පිළිබඳ අනතුරු ඇඟවීමක් (warning) සහ අනාගතයේදී ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය දන්වා ලිපියක් නිකුත් කරයි.

බැහැරවීම් ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනි වන නමුත්, එම උල්ලංඝනය කිරීම බරපතල ස්වභාවයේ නොමැති අවස්ථාවල දී, නිවැරදි කිරීම් කරවීමට මණ්ඩලය විසින් නියෝගයක් නිකුත් කරනු ලබයි. කෙසේ වුවද, එවැනි බැහැරවීම් මූල්‍ය ප්‍රකාශනවල නොමඟ යවන සුළු තත්ත්වයක් ඇති කරන අවස්ථාවල, ව්‍යවස්ථාව මත පදනම්ව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

3.2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ විශේෂ අවස්ථා

1995 අංක 15 දරන පනත යටතේ නිරීක්ෂණය කළ යුතු, පනත මඟින් දක්වා ඇති නිර්ණායක සපුරා ඇති නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුන්වනු ලබන ආයතන 1671ක් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මඟින් හඳුනාගෙන ඇත. ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් පෙර වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම වර්ෂය තුළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,564 ක් මඟින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,738 ක් ඉදිරිපත් කර තිබුණි. සංසන්දනාත්මකව සලකා බැලීමේ දී, පෙර වර්ෂය තුළ, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,517 ක් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,830 ක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කර තිබුණි.

වසර තුළ සමාලෝචනය කිරීමට සැලසුම් කර ඇති මූල්‍ය ප්‍රකාශන කට්ටල 550 හා සසඳන විට, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 534 කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 541 ක සමාලෝචන සම්පූර්ණ කරන ලදී. සංසන්දනාත්මකව සලකා බැලීමේ දී, ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2021 වර්ෂය තුළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 525 කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 552ක් සමාලෝචනය කර ඇත. ඉල්ලා අස්වීම හේතුවෙන් වසර අවසානයේ පරීක්ෂණ කාර්ය මණ්ඩලයේ අඩුවීම හේතුවෙන් සම්පූර්ණ කරන ලද සමාලෝචන සංඛ්‍යාවෙහි ආන්තික අඩුවීමක් සිදු වී තිබුණි. කෙසේ වුවද, 2021 වර්ෂය අවසානයේ පැවති පුරප්පාඩු පහට සාපේක්ෂව, වසර අවසානයේ තාක්ෂණික තනතුරු හයක් පුරප්පාඩු වී තිබියදීත්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2021 වර්ෂයේ දී ආවරණය කරන ලද නියාමනය කරන ලද ආයතනවලින් 48% කට සාපේක්ෂව, වසර තුළ නියාමනය කරන ලද ආයතනවලින් 78% ක් ආවරණය කරමින් අවධානම් පාදක ආවරණය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ හා සමානව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පෙර වසර තුළ ආවරණය කරන ලද 33% කට සාපේක්ෂව, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති ආයතනවලින් 95% ක් සමාලෝචනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල වඩාත් ඵලදායී ආවරණයක් සඳහා පහසුකම් සැලසීමට සහ ගෝලීය හොඳම භාවිතයන් සමඟ පෙළගැස්වීම සඳහා 2021 වර්ෂයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සම්බන්ධ කරගන්නා ලද චක්සත් රාජධානියේ උපදේශක විසින් කරන ලද ප්‍රධාන නිර්දේශ කිහිපයක් අනුග මනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රවර්තන වර්ෂය තුළ ද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරාගැනීමේ දී මිශ්‍ර ආකෘතියක් අනුග මනය කරමින් සමාලෝචන සිදු කරන ලදී. එහි දී අවදානම් පාදක ප්‍රවේශයක්, සහ අහඹු සහ මාරුවෙන් මාරුවට යොදාග න්නා ප්‍රවේශයන් ඒකාබද්ධ කරමින් එම ක්‍රියාවලිය සිදු කරන ලදී. ඉහත සඳහන් වාර්තා තෝරාගැනීමේ දී, අධි අවදානම් සහිත ආයතන තෝරා ගැනීම තීරණය කරන අවස්ථාවේදී ආයතනවල මහජන වගවීම පිළිබඳව ද සලකා බලන ලද අතර එමඟින් කලින් සඳහන් කළ පරිදි, සම්පූර්ණ කරන ලද සමාලෝචන වලින් 78% ක් නියාමනය කරන ලද ආයතනවල සමාලෝචන වලින් සමන්විත වූ අතර ඉතිරිය ආර්ථික වශයෙන් වැදගත් පෞද්ගලික ආයතන නියෝජනය කර තිබේ. සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මෙම සංයුතිය මඟින් සැලසුම් කර ඇති අවුරුදු 3-5 චක්‍රය තුළ ආවරණය කළ යුතු පෞද්ගලික ආයතනවල මූල්‍ය ප්‍රකාශන සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ.

අවදානම් මත පදනම් වූ ප්‍රවේශය යටතේ වූ සමාලෝචන, කර්මාන්ත කේන්ද්‍ර කර ගත් අවදානම් නිර්ණායක මත පදනම්ව කලින් තීරණය කරන ලද තේමා මත සිදු කරන ලදී. ඉහත සඳහන් තේමා කේන්ද්‍රීය සමාලෝචන ප්‍රවේශය මඟින් කාර්ය මණ්ඩලයට උසස් තත්ත්වයේ ආයතනික වාර්තාකරණයක් සඳහා වැදගත් වන අංශ හඳුනා ගැනීමට මග පෑදූ ප්‍රමිතිවල නිශ්චිත අංශ පිළිබඳ වඩාත් ගැඹුරින් අවධානය යොමු කිරීමට හැකි විය.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වසර තුළ අවධානය යොමු කරන ලද ප්‍රධාන තේමාවන් අතරට බැංකුවල පෞද්ගලිකව වැදගත් වන ගනුදෙනුකරුවන්ගේ හානිකරණය, මූල්‍ය සමාගම්වල අවදානම් හෙළිදරව් කිරීම්, ජීවිත රක්ෂණ සමාගම්වල මූල්‍ය වත්කම් හඳුනා ගැනීම සහ ඇගයීම සහ රක්ෂණ සමාගම්වල මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය, ආදායම් හඳුනාගැනීම, මුදල් ප්‍රවාහ ප්‍රකාශවල ඉදිරිපත් කිරීම සහ ද්‍රවශීලතා හෙළිදරව් කිරීම් සහ ලැයිස්තුගත වැවිලි සමාගම් වල විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් වලට අමතරව ලැයිස්තුගත සමාගම් වල බදු හෙළිදරව් කිරීම් ද ඇතුළත් විය.

2019 වසරේ සිට තාක්ෂණික තනතුරු තුනක් පුරප්පාඩු වී පැවතීම සහ 2021 වර්ෂයේ සිට තාක්ෂණික අධ්‍යක්ෂ තනතුරේ එක් (1) පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් පරීක්ෂණ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහිතව වර්ෂය ආරම්භ කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයට සිදු විය. වසර තුළ තවත් තාක්ෂණික අධ්‍යක්ෂකවරයෙකු ඉල්ලා අස්වීමත් සමඟ පුරප්පාඩු සංඛ්‍යාව තවදුරටත් වැඩි විය. ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිතව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ නියාමන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ අරමුණින්, 2021 වසරේ විශේෂ වැටුප් පරිමාණයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබියදීත් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.හි සේවයේ නියුතු දක්ෂ වරලත් ගණකාධිකාරිවරුන් බඳවා ගැනීම් සහ පාරිශ්‍රමික නිර්ණායක සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට මුදල් අමාත්‍යාංශයට නොහැකි වීම නිසා එකී අධ්‍යක්ෂ තාක්ෂණික තනතුරු තුන (3) සහ සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික තනතුරු දෙක (2) පුරප්පාඩු වී පැවතුණි. තවද, 2020 අවසාන කාර්තුව තුළ එක් (1) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු අධ්‍යක්ෂ ජනරාල් ලෙස උසස් වීමත් සමඟ, 2022 අවසානය වන විට සමස්තයක් වශයෙන් තාක්ෂණික තනතුරු හතක් (7) පුරප්පාඩු වී තිබුණි. ඒ අනුව, වසර අවසානයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචන මෙන්ම විගණන පරීක්ෂණ සිදු කිරීම සඳහා පරීක්ෂණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හත (7) දෙනෙකු පමණක් සේවයේ නිරතව සිටි අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපේක්ෂිත සංඛ්‍යාවට වඩා අඩු මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාවක් සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාවක් සම්පූර්ණ කරන ලදී.

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

3.3. මණ්ඩලයේ කාර්යසාධන සංඛ්‍යාලේඛන

		2021	2022
1.	**හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලච්ඡේදයේ අවසාන දිනට)**	1,680	1,671
2.	**ලැබුණු මූල්‍ය ප්‍රකාශන**		
	මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (පෙර වර්ෂ කිහිපයක් සඳහා අදාලව ලැබුණු මූල්‍ය ප්‍රකාශන ඇතුළුව)	1,830	1,738
	නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව	1,517	1.564
3.	**සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (සම්පූර්ණ කරන ලද)**		
	සමාලෝචන සංඛ්‍යාව	552	541
	නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව	525	534
4.	**සමාලෝචනවලින් සොයාගත් දෑ**		
	4.1 අනුකූලවීම්		
	මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව	312	344
	නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව*	301	341
	4.2 නිරීක්ෂණ සහිතව අනුකූල වීම්		
	මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව	237	194
	නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව*	226	192
	4.3 අනුකූල නොවීම්		
	(චිකඟතා, විධාන, අනතුරු ඇඟවීම්)		
	මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව	3	3
	නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව*	3	3
5.	**සමාලෝචනය කළ මූල්‍ය ප්‍රකාශනවල % ලෙස මූල්‍ය ප්‍රකාශන වලින් සොයා ගැනීම්**		
	අනුකූලවීම්	56%	63%
	නිරීක්ෂණ සහිතව අනුකූල වීම්	43%	36%
		99%	99%
	අනුකූල නොවීම් (චිකඟතා, විධාන, අනතුරු ඇඟවීම්)	1%	1%
6.	**සේවයේ නිරතව සිටින තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව (වසර අවසානයේ)**	10	9

** සමාලෝචනය කරන ලද වර්ෂ කිහිපය හැර*

සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 1%ක් අනුකූල නොවන බව 2022 වර්ෂයේ සමාලෝචන සොයාගැනීම් මගින් අනාවරණය විය. සමාලෝචන තුළදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර මත පදනම්ව, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 63%ක් අනුකූල වීම් බවත්, මූල්‍ය ප්‍රකාශනවලින් 36%ක් අනුකූල වීම් වුවද තවදුරටත් අනුකූලතාවන් දියුනු කිරීම පිණිස ආධාරක ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණ අදාල බවත් පෙන්වා දෙන ලදී.

මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු මට්ටමින් වෙනස් කළ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අදාළ නියමයන්වලින් ප්‍රමාණාත්මක බැහැරවීම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකක මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. ඒ අනුව, ඊළඟ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් වගකීම් ආකාරයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ලබා ගන්නා ලදී. තවද, නොමඟ යවන සුළු තොරතුරු ඉදිරිපත් කිරීම 1995 අංක 15 දරන පනත උල්ලංඝනය කිරීමක් බවට උපදෙස් ලබා දෙමින්, මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී මින් පෙර භාවිතා නොකළ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ලැයිස්තුගත ආයතනයක් වෙත අනතුරු ඇඟවීමක් (Warning) නිකුත් කරන ලදී.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිත කරමින් ක්‍රියා පටිපාටි භාවිතා කිරීම අවශ්‍ය වන මට්ටමට ප්‍රමාණාත්මක (Material) නොවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම් අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් පුළුල් ලෙස පරීක්ෂණ සිදු නොකර, ලිපි මගින් නිරීක්ෂණ ලෙස නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලට දැනුම් දෙනු ලැබූ අතර එමඟින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලට අවශ්‍ය අවස්ථාවලදී එම ව්‍යවසායයන් මගින්ම අනුකූලතාවය වැඩිදියුණු කළ හැකි වනු ඇත. වර්ෂය තුළ දී, මූල්‍ය ප්‍රකාශන කට්ටල 194ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි නිකුත් කරන ලදී. (2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් සම්බන්ධ විස්තර සඳහා පිටු අංක 18 සිට 21 දක්වා ද, 2022 වර්ෂය තුළ ලබාගත් චිකඟතාවන් සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම් සඳහා 22 සහ 23 පිටු බලන්න).

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

4. විගණන පරීක්ෂාව

පූර්ව වර්ෂය තුළ දී පරීක්ෂා කරන ලද විගණන ආයතන 17 ක් මගින් සිදුකරන ලද විගණන 34ක් සමඟ සැසැඳීමේ දී, මෙම වර්ෂය තුළ, විගණන ආයතන 9 ක් මගින් සිදු කරන ලද විගණන 33 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. ඉල්ලා අස්වීම් මගින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ පරීක්ෂණ කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් පරීක්ෂණ සංඛ්‍යාව මෙසේ අඩු වී තිබුණි.

වර්ෂය තුළ අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් මත තෝරා ගන්නා ලද විගණන ලිපි ගොනු වල පරීක්ෂණ සිදු කරන ලදී. එවායේ සොයාගැනීම් මත පදනම්ව, විගණන 23 ක් පරීක්ෂණවලදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍රවලට අදාළව ශ්‍රී.ලං.වි.ප්‍ර. සමඟ අනුකූල වී තිබුණි. ඉතිරි පරීක්ෂණ 10 න්, විගණන පරීක්ෂණ 9 ක සොයාගැනීම් සඳහා ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන අතර එම සොයාගැනීම් නිරීක්ෂණ ලිපි මගින් අදාළ විගණකවරුන් වෙත දන්වන ලදී. මෙම සොයාගැනීම් සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීම සහ අදාළ හෙළිදරව් කිරීම්, විගණන සැලසුම් කිරීම, විගණන නියැදීම, අඛණ්ඩ පැවැත්ම, මතයක් සැකසීම සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්තා කිරීම සහ වංචා සහ ප්‍රමාණාත්මකතාව සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම ඇතුළු විගණන ගිණුම් ඇස්තමේන්තු ක්ෂේත්‍රවල විගණන අඩුපාඩු හා සම්බන්ධ විය. මීට අමතරව, වසර තුළ ක්ෂේත්‍ර කටයුතු අවසන් කරන ලද එක් විගණන පරීක්ෂණයකට අදාළ නිරීක්ෂණ ලිපිය නිකුත් නොකළ අතර, එහි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට අදාළ වැඩිදුර තොරතුරු රැස් කෙරෙමින් පැවති බැවින් වසර අවසානයේ දී විගණන පරීක්ෂණය සම්පූර්ණ වී නොතිබුණි.

2021 වර්ෂයේදී විගණන ආයතන 12ක් මගින් සිදු කරන ලද විගණන 12 හා සැසඳීමේ දී, විගණන සමාගම් 5ක විගණන 9 ක් සඳහා අඩුපාඩු සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ සන්නිවේදනය කරන ලදී. ලැයිස්තුගත ආයතනයක කීර්ති නාමය පිළිබඳ වාර්ෂික හානිකරණ පරීක්ෂාව විගණනය කිරීමේදී ප්‍රමාණවත් වෘත්තීය නිපුණතාවක් සහ නිසි සැලකිල්ලක් දැක්වීමට අපොහොසත් වීම මත විගණකවරයා විසින් විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් මෙම විගණකවරුන් අතරින් එක් විගණකවරයෙකුට අවවාද කිරීමේ ලිපියක් නිකුත් කරන ලදී. (2022 වර්ෂය තුළ විගණන පරීක්ෂා කිරීම්වල සොයාගැනීම් සඳහා පිටු අංක 24 සිට 27 දක්වා බලන්න.)

5. විමර්ශන

5.1. ඇඩම් කැපිටල් පීඑල්සී සමාගම

ඇඩම් කැපිටල් පීඑල්සී සමාගම විසින් නිසි ගිණුම් පොත් සහ අදාළ වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වූ විට වත්මන් විගණකවරයා විසින් සමාගම වෙත තත්ත්වාගණනය නොකළ මතයක් නිකුත් කර තිබුණු බැවින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස ඉල්ලුම්න් නියෝගයක් නිකුත් කරනු ලැබුව ද, නැවත විගණනයක් සිදු කිරීම සඳහා දැරිය යුතු අමතර පිරිවැය දැරීමට සමාගම කැමැත්තක් නොදැක්විය.

අනතුරුව, එම විගණකවරයා විසින් අඛණ්ඩව විගණන ප්‍රමිතීන් උල්ලංඝනය කර ඇති බවත්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් සන්නිවේදනය කරන ලද කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර නොමැති බවත් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් නිරීක්ෂණය කරන ලද අතර ඒ සම්බන්ධයෙන් එම විගණකවරයාට සහ සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

6. ප්‍රමිති සකස් කරන ආයතනයට සහාය දැක්වීම

1995 අංක 15 දරන පනත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිති කමිටුව ශ්‍රී ලංකාව තුළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සම්මත (නීතිගත) කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාවට නිර්දේශ නිකුත් කරන අතර ඒ සඳහා අවශ්‍ය සහාය ද ලබා දෙයි.

2022 වර්ෂය තුළ, ඉහත කී කමිටු දෙක විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් අතරට 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අය කරනු ලබන අධිභාර බදු ගිණුම්කරණය පිළිබඳව සහ ණය කළඹ නැවත වර්ගීකරණය කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිකාර ප්‍රකාශයක් (SoAT) නිකුත් කිරීම, නව සහ සංශෝධිත තත්ත්ව කළමනාකරණ ප්‍රමිතීන් (SLSQM 1, SLSQM 2 සහ SLAuS 220 (සංශෝධිත) සම්මත කිරීම, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති පිළිබඳ මාර්ගෝපදේශ සටහන් කිහිපයක් නිකුත් කිරීම, 2023 වර්ෂයේ දී බලපැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සංශෝධනය කිරීම සහ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම, එවැනි මත ප්‍රකාශ කිරීම් සිංහල සහ දෙමළ භාෂා වලට පරිවර්තනය කිරීම, ප්‍රකාශයට පත් කරන ලද කෙටුම්පත් වලට IFRS / ISAs පිළිබඳ සාකච්ඡා වලට සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය සහ ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද සංශෝධන වලට ප්‍රතිචාර දැක්වීම සහ නව හෝ සංශෝධිත ප්‍රමිතීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළත් විය.

2022 වර්ෂයේදී ප්‍රමිත සැකසීමේ කටයුතු සඳහා සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත වාර්ෂික ප්‍රදානයක් ලබාදීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ පැවති අතීත වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යාමේ දී, කමිටු දෙකෙහි පිරිවැය කොටසක් මූල්‍යකරණය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සම්මත කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත රු. මිලියන 4ක් ගෙවන ලදී. (2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රමිත සැකසීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා පිටු අංක 41 සහ 42 බලන්න).

7. ජාත්‍යන්තර සබඳතා

මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ අනුකූලතා අධීක්ෂණය සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් ලොව පුරා සිදුවන වර්ධනයන්ට අනුගතව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය බොහෝ ජාත්‍යන්තර සංවිධාන වල සාමාජිකත්ව ලබාගෙන ඇත. අනෙකුත් ගෝලීය නියාමකයින්නේ තොරතුරු සහ සහාය ලබා ගැනීමේ අවස්ථාව සහ බොහෝ නියාමකයින්ට ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම් හවුල් ක්‍රියාකාරකම් ලෙස සිදු කිරීමට අවස්ථාව මෙම අනුබද්ධතාවය මගින් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට විවර වී තිබේ.

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් පහත සඳහන් ජාත්‍යන්තර සංවිධාන වල සාමාජිකත්වය පවත්වාගෙන යයි.

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - 2007 වර්ෂයේ පැවති එහි පළමු පූර්ණ (Plenary) රැස්වීමේ සිට

ආ) ජාත්‍යන්තර විගණන සහ තහවුරු කිරීමේ ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශක කණ්ඩායම - 2007 වර්ෂයේ දී සාමාජිකයෙකු විය.

ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශක කණ්ඩායම - 2009 වර්ෂයේ දී සාමාජිකයෙකු විය.

මීට අමතරව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ කාර්ය මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර ගිණුම්කරණය සහ වාර්තාකරණය පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥයින්ගේ (ISAR) සැසිවාරයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරයි.

තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2018 වර්ෂයේ සිට නිරීක්ෂකයෙකු වශයෙන් ASEAN විගණන නියාමක කණ්ඩායම (AARG) නියෝජනය කරයි.

ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ භෞතිකව පැවැත්වීම සම්බන්ධයෙන් එල්ල වූ අභියෝග ජයගැනීමේ පියවරක් ලෙස ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. ම සාමාන්‍යයෙන් සහභාගී වන සියලුම ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ මෙම වසර තුළ මාර්ගගත සැසි ලෙස පවත්වන ලදී.

මෙම දැනුම වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රයෝජනයට ගනිමින්, 2022 වර්ෂය තුළ එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු උපදේශන කණ්ඩායම් දෙකේ රැස්වීම්වලට සහභාගී වූ අතර එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) පූර්ණ රැස්වීමට සහභාගී විය. තවද, සියලුම තාක්ෂණික කාර්ය මණ්ඩලයට 2022 IFIAR පරීක්ෂණ වැඩමුළුව, IFIAR බලාත්මක කිරීමේ වැඩමුළුව සහ සාමාන්‍ය තත්ව යටතේ IFIAR පූර්ණ රැස්වීමේ න්‍යාය පත්‍ර අයිතමයක්ව පවතින ගෝලීය මහජන ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් වන විගණන ව්‍යාපාරික ආයතන සමඟ පවත්වනු ලබන සංසදවලදී මාර්ගගත සැසිවලට සහභාගී වීමට අවස්ථාව ලබා දී ඇත.

ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) විසින් පවත්වනු ලබන සැසි සඳහා ලොව පුරා ස්වාධීන විගණන නියාමකයින් සහභාගී වන හෙයින්, මෙම රැස්වීම් සහ සම්මන්ත්‍රණ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සඳහා තොරතුරු හුවමාරු කිරීමේ වේදිකාවක් නිර්මාණය කරයි.

මෙම ගෝලීය සැසිවාර සඳහා සහභාගී වීම ශ්‍රී ලංකා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ ධාරිතා ගොඩනැගීමට අතීතයේ දී මෙන්ම වැදගත් වී ඇති අතර මෙහි දී රැස්වීම්, පරීක්ෂණ වැඩමුළු සහ විගණන නියාමනයට අදාළ සම්මන්ත්‍රණවලට සහභාගී වීමට මෙන්ම ලොව පුරා සිටින සෙසු විගණන නියාමකයින් සමග සාකච්ඡා කිරීමට සහ ජාලගත වීමට හැකියාව ලබාදී ඇත. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් රට තුළ නියාමන පරිසරය ශක්තිමත් කිරීම සඳහා එහි නියාමන යාන්ත්‍රණය වෙනස් කිරීමට ගෝලීය හොඳම භාවිතයන් පිළිබඳ අධ්‍යයන ඉවහල් වී ඇත. එමෙන්ම, මෙම ජාලගත යාන්ත්‍රණ හරහා, වසර තුළ අනුගමනය කරන ලද නියාමන ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ නියාමනය සහ විගණන නියාමනය කිරීමේ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් හඳුනා ගැනීමට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට හැකි විය.

8. මානව සම්පත්

8.1. කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය දහසය (16) දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් දස (10) දෙනෙක් වරලත් ගණකාධිකාරීවරු වූහ. සමස්ත තාක්ෂණික කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු (3) සහ සහකාර අධ්‍යක්ෂවරුන් හතර (4) දෙනෙකුගෙන් සමන්විත විය. දක්ෂතා සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙන්ම සේවයේ රඳවා ගැනීම සඳහා පසුගිය කාලයේ මුදල් අමාත්‍යාංශයෙන් පහසුකම් සලසා දෙන ලද පරිදි, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ තිදෙනෙකු (3) කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති අතර හත් (7) දෙනෙකු ස්ථිර පදනමින් සේවයේ යොදවා තිබේ.

අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස උසස්වීම හේතුවෙන් 2020 අවසන් කාර්තුව තුළ පුරප්පාඩු වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධූරය, 2019 ජනවාරි මාසයේ සිට පුරප්පාඩු වූ අධ්‍යක්ෂ තාක්ෂණික තනතුර, 2019 අවසානයේ සිට පුරප්පාඩු වූ සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩු 2ක් ඇතුළු තාක්ෂණික තනතුරු පුරප්පාඩු 5ක් 2021 වසර පුරා ද පුරප්පාඩුව පැවතුණි. අමාත්‍යාංශ චක්‍රලේඛ වලට අනුව අදාළ වන වැටුප් පරිමාණවලට මනා පළපුරුද්දක් ඇති, තාක්ෂණික වශයෙන් ප්‍රවීණ, වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සමත් නොවීම මෙයට හේතුව විය. කෙසේ වුවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අමාත්‍යාංශය සමඟ පැවැත් වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස, මණ්ඩලය වෙත වෘත්තීයමය වශයෙන් ප්‍රවීණ, වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැටුප් ලබා දීමට 2021 ජුනි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව, එකී තනතුරු සඳහා 2021 අගෝස්තු මාසයේ දී සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය (SoR) ඉදිරිපත් කරන ලද අතර, නියාමන ආවරණය වැඩිදියුණු කිරීම පිණිස ඉහත සඳහන් කළ වෘත්තීය තනතුරු පිරවීමට කටයුතු කිරීම සඳහා ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය අපේක්ෂාවෙන් සිටියි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් වර්ෂය තුළ නියමිත බඳවා ගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කරමින්, 2018 වසරේ අනුමත කරන ලද මූල්‍ය හා පරිපාලන විධායක නිලධාරී තනතුර පුරවන ලද අතර එය අභ්‍යන්තර උසස්වීමක් මගින් සිදු කරන ලදී. මීට අමතරව, පුරප්පාඩු වූ ලේකම් තනතුර ද වර්ෂයේ අවසාන කාර්තුවේ දී පුරවන ලදී. කෙසේ වුවද, වර්ෂය අවසානය වන විට, වත්මන් සේවක සංඛ්‍යාව තුළ විධායක ශ්‍රේණියේ පුරප්පාඩු 5ක් පැවතුණි. මෙය 2018 නව සේවක සංඛ්‍යා අනුමැතියෙන් පිරවීමට නියමිත විධායක ශ්‍රේණියේ තනතුරු 7ට අමතරව පුරප්පාඩුව පවතින තනතුරු වේ.

අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාව සිදුකිරීම සීමා කරමින් සමාලෝචන කටයුතුවල නියැලී සිටින ප්‍රවීණ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පැවැති අඛණ්ඩ හිඟය හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල මූලික සමාලෝචන කාර්යයන් සිදු කිරීම සඳහා වසර ගණනාවක් පුරා ලබා ගත් බාහිර සමාලෝචක මණ්ඩලයේ සේවය වර්ෂය තුළ දී ද අඛණ්ඩව ලබා ගන්නා ලදී.

කෙසේ වුවද, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ උග්‍ර හිඟය ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සීමා කිරීම සඳහා

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

මූලික ලෙස බලපා ඇති අතර, මෙම ගැටළු හැකිතාක් විසඳීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සෑම වෑයමක්ම ගෙන ඇත. එසේ කිරීමේ දී, මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයේ සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ රේඛීය අමාත්‍යාංශය වන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ඉහත සඳහන් කාර්ය මණ්ඩල සම්බන්ධ ගැටළුව සාකච්ඡා කර ඇති අතර, නියාමන කාර්යය ශක්තිමත් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශවලින් සුදුසු අනුමැති අපේක්ෂාවෙන් සිටී.

8.2. බාහිර සමාලෝචක මණ්ඩලය

2012 වසරේ කෝප් කමිටුවේ නිර්දේශවලට අනුකූලව කටයුතු කිරීමේ පියවරක් ලෙස ලැබුණු බාහිර සමාලෝචකයින්ගේ සේවය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් තම කාර්ය මණ්ඩලය මගින් සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව වැඩි කිරීමට දරන ලද ප්‍රයත්නයේ දී, මෙම වසර තුළ ද අබණ්ඩව ලබා ගන්නා ලදී. ඒ අනුව, 2021 වසරේ සේවය ලබා ගන්නා ලද සමාලෝචකයින් 16 සමඟ සැසඳීමේ දී, වසර අවසානයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සතුව බාහිර සමාලෝචකයෝ 13 ක් සිටියහ.

බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, බාහිර සමාලෝචකයින් විසින් සිදු කරන ලද සමාලෝචනවල ගුණාත්මකභාවය පිළිබඳ ඇගයීමක් වරින් වර පවත්වනු ලැබේ. සමාලෝචකයන්ගේ ඇගයීමේ ප්‍රතිඵල මත පදනම්ව, සමාලෝචකයන්ගේ සේවා අබණ්ඩව පවත්වාගෙන යෑම හෝ අත්හිටුවීම සිදු කරනු ලැබේ. මෙමගින් සමාලෝචකයින්ගේ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වන අතර, බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද එමඟින් පහසුකම් සැලසේ.

වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද සමාලෝචන අතරින්, බාහිර සමාලෝචකයින් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 59 ක් සඳහා මූලික සමාලෝචන සිදු කරන ලදී. වර්ෂය තුළ බාහිර සමාලෝචකයින් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 66 ක මූලික සමාලෝචන සිදු කරන ලද අතර ඔවුන්ගේ සේවාවන් සඳහා රු. මිලියන 0.66 ක් වැය විය.

බාහිර සමාලෝචකයන්ගේ සොයාගැනීම් මත පදනම්ව ඉහත කී මූල්‍ය ප්‍රකාශන කට්ටල 59 හි සමාලෝචන සම්පූර්ණ කිරීමේදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සාමාජිකයින්ට අමතර තොරතුරු ලබා ගැනීමට, නිවැරදි කිරීම් සඳහා එකඟතා ලබාගැනීමට සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීමට සහ ව්‍යවස්ථාව යටතේ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය. මීට අමතරව, වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන අතරින්, මූල්‍ය ප්‍රකාශන කට්ටල 482 ක මූලික සමාලෝචනය ද මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

9. ආයතනික පාලනය

ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මගින් පාලනය වේ. ඒ අනුව, නිල බලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සහ හඳුනා ගත් ආයතනවලින් ලැබුණු නාමයෝජනාවලින් මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන් නිල බලයෙන් පත්වන සාමාජිකයින් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3), වික්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව, ශ්‍රී ලංකා නීතීඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකු සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කළ නිලධාරීන් පත් කළ සාමාජිකයින් වේ. පත්කරන ලද සාමාජිකයෙකුගේ ධූර කාලය වසර හතරකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ජේ.පී.ආර්. කරුණාරත්න මහතා වසරේ මාස පහක් සභාපතිවරයා වශයෙන් කටයුතු කළ අතර ඉන් පසුව, 2022 ජූනි 6 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිනිය වූ කේ.එම්.ඒ.එන්. දවුලගල මහත්මිය සභාපතිනිය වශයෙන් කටයුතු කළාය.

වර්ෂය තුළ ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන එම්.පී. අබේසේකර මිය, ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා, පී.ආර්.ඒ.අයි. ගුණරත්න, කේ.කේ.එස්. ගුණවර්ධන සහ මහාචාර්ය ඒ. ජයමහ යන මහත්වරු වර්ෂය තුළ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි අධ්‍යක්ෂවරුන් හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස සේවය කළහ. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වූ එච්.එම්.ඒ. ජයසිංහ සහ ඩබ්ලිව්.ඩබ්ලිව්.ජේ.සී. පෙරේරා යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරනු ලබන වෘත්තීය ගණකාධිකාරී සමාගම්වල හවුල්කරුවන් ලෙස කටයුතු කළ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වූ එස්.එම්.එස්.එස්. බණ්ඩාර මහතා ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරන වෘත්තීය ගණකාධිකාරී සමාගමක හවුල්කරුවෙකු ලෙස කටයුතු කළේය.

තවද, එම කාලසීමාව තුළ මණ්ඩලයේ ආරාධිතයෙකු වන ටී.ජේ.එස්. රාජාකාරිය මහතා ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරන වෘත්තීය ගණකාධිකාරී සමාගමක හවුල්කරුවෙකු ලෙස කටයුතු කළේය.

මණ්ඩලයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, මණ්ඩලයේ සියලුම සාමාජිකයින් විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සමඟ මෙන්ම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සහ විගණකවරුන් සමඟ ඔවුන්ගේ සම්බන්ධිත පක්ෂ සබඳතා කාර්තුමය පදනමින් හෙළිදරව් කරයි. ඒ අනුව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක හෝ එහි විගණකවරයාට සම්බන්ධ කරුණුවලට අදාළ සියලුම ලේඛන අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ එහි විගණකවරයා සමඟ සම්බන්ධයක් ඇති සාමාජිකයින්ට යවන ලේඛනවලින් ඉවත් කර ඇති අතර එවැනි සාමාජිකයෝ එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ විගණකවරුන් සම්බන්ධ විෂයයන් පිළිබඳ සාකච්ඡා සඳහා සහභාගී නොවෙති.

වරින් වර භෞතික කටයුතු සඳහා කාර්යාලය වසා දැමීම සහ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ උපදෙස් මධ්‍යයේ වුවද, මණ්ඩලය විසින් නියමිත පරිදි අබණ්ඩව රැස්වීම් කැඳවනු ලැබූ අතර වසරේ වැඩි කාලසීමාවක් තුළ මාර්ගගත රැස්වීම් පවත්වන ලද අතර ඇතැම් විට භෞතික වශයෙන් රැස්වීම් පවත්වන ලදී. ඒ අනුව, වර්ෂය තුළ මණ්ඩලය මගින් රැස්වීම් 9 ක් පවත්වන ලදී.
වර්ෂය තුළ මණ්ඩලයේ සාකච්ඡා මගින් සමස්ත මෙහෙයුම් දර්ශක අනුව කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය සහ විගණකවරුන් සම්බන්ධ සැලකිය යුතු තාක්ෂණික ගැටළු විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආවරණය කරන ලදී. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම සම්බන්ධ ගැටළු පිළිබඳව ද, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

සහ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සඳහා ද මණ්ඩලය සිය අවධානය යොමු කරන ලදී. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එහි ඵලදායී ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කටයුතුවල සහ දැනට සංශෝධනය කරමින් පවතින ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩල පනතේ සංශෝධන සමාලෝචනය කිරීමේ කටයුතුවල නිරත විය.

තවද, තාක්ෂණික කාර්යයන් ඉටු කිරීම සඳහා යෝග්‍ය වෘත්තීය කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකි වීම පිළිබඳව පවතින ගැටලුව විසඳීමට සහ 2021 වසරේ සිට නොවිසඳී ඉතිරිව පවතින සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටි සඳහා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා දීම කඩිනම් කිරීමට මණ්ඩලය දැඩි උත්සාහයක් ගන්නා ලදී. මෙම ක්‍රියාවලියේදී මණ්ඩලය මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ රැස්වීම් ගණනාවක් පවත්වා ඇති අතර ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සහ ඒවා භාවිත කිරීම පිළිබඳ මනා දැනුමක් ඇති, දක්ෂ වරලත් ගණකාධිකාරිවරුන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට කාර්ය මණ්ඩල වැටුප් සම්බන්ධ විකල්ප ක්‍රම සමාලෝචනය කර ඇත.

මණ්ඩලයේ කාර්ය ප්‍රතිපත්තියට අනුව, තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය, විගණන පරීක්ෂා කිරීම, විමර්ශන පැවැත්වීම සහ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම වැනි ප්‍රමිතීන්ට අනුකූලතාව අධීක්ෂණය කිරීමට අදාළ නිරන්තර මෙහෙයුම් වසර තුළ අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී.

10. මූල්‍ය කාර්යසාධනය

වසර තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ ප්‍රධාන මූල්‍යකරණ මූලාශ්‍රය රජය විසින් සපයන ලද අරමුදල් විය. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මණ්ඩලයේ ක්‍රියාකාරකම් රජයේ අරමුදල් හරහා මූල්‍යකරණය කරනු ලැබුවද, මණ්ඩලයේ වියදම් මූල්‍යකරණය කිරීමේ විකල්පයක් ලෙස, පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන, කොටස් හිමියන්ගේ හිමිකම් හෝ බදු පසු ලාභය යන දෙකෙන් වැඩි අගයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ සෙස් බද්දක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් අය කළ හැකි වේ. කෙසේ වුවද, මෙම විකල්පයට මුදල් අමාත්‍යාංශය කැමැත්ත පළ නොකළ අතර 2008 ජනවාරි 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමා සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සෙස් බද්ද ගරු අමාත්‍යවරයා විසින් 2008 ඔක්තෝබර් 7 දින ඉවත් කර ගන්නා ලදී.

වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් රු.77,325,194/-ක මුදලක් මෙහෙයුම් කටයුතු සඳහා වැය කරන ලද අතර, එයට සාපේක්ෂව, 2021 වර්ෂය සඳහා මෙහෙයුම් වියදම් රු. 71,236,691/- ක් වී තිබුණි. කොවිඩ් 19 ව්‍යාප්තියට එරෙහිව ගන්නා ලද පූර්වාරක්ෂක පියවරක් ලෙස, 2021 වසරේ සැලකිය යුතු කාලසීමාවක් තුළ මෙන්ම ඉන්ධන හිඟය නිසා ඇති වූ ගමන් දුෂ්කරතා හේතුවෙන් 2022 වර්ෂයේ අඩු කාලසීමාවක් තුළ කාර්ය මණ්ඩලය නිවසේ සිට වැඩ කිරීම හේතුවෙන් එම වසර දෙකක කාලය තුළ වියදම් පූර්ව කොවිඩ් කාලයේ වියදම්වලට සාපේක්ෂව අඩු විය. කෙසේ වුවද, ඉහළ යන උද්ධමනය හේතුවෙන් පිරිවැය ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසරේ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි විය.

වසර තුළ ඉහළ ගිය වියදම් වලට හේතු වූයේ, වසර දෙකක වාර්ෂික වාර්තා ඇතුළත්ව වාර්ෂික වාර්තා මුද්‍රණ පිරිවැය ඉහළ යාම සහ ඉකුත් වර්ෂයේ අඩු ප්‍රතිපාදන වලට අදාළ ගැළපීම් සිදු කිරීම, මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වල කොටසක් වශයෙන් සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත මෙන්ම විගණන ආයතන වෙතද යවන ලද නියාමන සොයාගැනීම් මුද්‍රණය කිරීමේ පිරිවැය ඉහළ යෑම, කාර්ය මණ්ඩල සුබසාධනයේ වැඩි කිරීම් සහ පවතින වියදම් ඉහළ යාම හේතුවෙන් කාර්යාල ලිපිද්‍රව්‍ය පිරිවැය ඉහළ යෑමය. තවද, වසර තුළ බාහිර සමාලෝචකයින් වෙත පවරා ඇති මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වර්ගවල සංයුතියේ වෙනස්වීම් හේතුවෙන් බාහිර සමාලෝචකයින් සඳහා ගෙවීම් ද ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළ නැඟ තිබුණි. එසේම දැනට භාවිත කරන මෝටර් රථ වර්ෂ 8-11කට වඩා පැරණි වීම හේතුවෙන් වාහන පිරිවැය ඉහළ යාම සහ නඩත්තු හා අලුත්වැඩියා වියදම් ඉහළ යාම හේතුවෙන් වාහන නඩත්තු වියදම් ඉහළ නැඟ තිබුණි.

කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සඳහා සංවර්ධකයෙකු ප්‍රසම්පාදනය කිරීම සහ අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සම්බන්ධව 2021 වර්ෂයේ දී වැඩි දැන්වීම් සංඛ්‍යාවක් ප්‍රසිද්ධ කිරීම හේතුවෙන් පුවත්පත් නිවේදන සඳහා වැය වූ පිරිවැය අඩු වීම, දේශීය පුහුණු ක්‍රියාකාරකම් වලට සීමා කිරීම මගින් කාර්ය මණ්ඩල පුහුණුකිරීම් වලට අදාළව පිරිවැය අඩු වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අඩු විය. මීට අමතරව, වසර තුළ මිලදී ගත් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාශන සංඛ්‍යාව සීමා කිරීම හේතුවෙන් පොත් සහ වාර සඟරාවල පිරිවැය ද අඩු විය.

කෙසේ වුවද, නිවසේ සිට වැඩ කිරීම පදනම් කර ගත් ක්‍රියාකාරිත්වය මගින් ඉකුත් වර්ෂය තුළ වැය කරන ලද අඩු මෙහෙයුම් පිරිවැය මෙන්ම මෙම වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇති වියදම් වැඩිවීම හේතුවෙන් වසරේ මෙහෙයුම් පිරිවැයේ ආන්තික වැඩිවීමක් පිළිඹිබු විය. මෙහෙයුම් වියදම් අතරින්, වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැය, ඉකුත් වර්ෂයේ කාර්ය මණ්ඩල පිරිවැය වූ රු. 36,828,568/- හා සැසඳීමේ දී, රු. 39,766,516/- ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 8% ක වර්ධනයක් පෙන්නුම් කරයි. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මණ්ඩලයේ කාර්ය මණ්ඩල පිරිවැය ඉකුත් වර්ෂයට සමාන වන අන්දමින් 2022 වර්ෂයේ මෙහෙයුම් වියදම්වලින් 51% ක් නියෝජනය කරන ලදී.

11. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සංවර්ධනය කිරීම

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මණ්ඩලයේ මෙහෙයුම් සඳහා මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම මගින් අතින් පවත්වාගෙන යනු ලබන ලේඛනවල පොදු කාර්ය වියදම් අවම කිරීමට මෙන්ම තොරතුරු ගබඩා කිරීම වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය අතර මෙන්ම ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර එනම්, ආයතන සහ ඔවුන්ගේ විගණකවරුන් අතර තොරතුරු කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාවලිය මගින් වෘත්තීය කාර්ය මණ්ඩලය සාමාන්‍ය දත්ත සමුදා කළමනාකරණ ක්‍රියාකාරකම්වලින් නිදහස් කර ගැනීමටත්, නියාමන යාන්ත්‍රණය කෙරෙහි වෘත්තීය නිපුණතා උපයෝගී කර ගැනීම උපරිම කිරීම සඳහා ඔවුන්ට හැකියාව ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

2021 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මණ්ඩලය විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සඳහා එෂි සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් මෘදුකාංග සංවර්ධකයාට රු. මිලියන 38 ක මුළු පිරිවැයකට

ක්‍රියාකාරකම් වාර්තාව - 2022

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. රජයේ අවශ්‍යතා වලට අනුකූලව, MIS ව්‍යාපෘතිය සඳහා උපදේශකයා ලෙස ICTA පත් කරන ලදී. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ අධීක්ෂණය සහ මගපෙන්වීම මත MIS ව්‍යාපෘතිය 2022 වර්ෂයේ 1 වැනි කාර්තුව දක්වා වූ ව්‍යාපෘති කාලසීමාව තුළ ක්‍රමානුකූලව ප්‍රගතියක් ලබා ඇති අතර මෘදුකාංග සංවර්ධකයා සමඟ ඇතිකර ගත් ගිවිසුම මත පදනම්ව, 2022 මැද භාගය වන විට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි MIS ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

2022 මාර්තු මාසය අවසන් වන විට, මෘදුකාංග සංවර්ධකයා විසින් මූලික නොවන මොඩියුලවල පද්ධති සංවර්ධනය සම්පූර්ණ කර තිබුණු අතර, මූලික මොඩියුලවල පද්ධති සංවර්ධනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතරතුර පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) සිදු කිරීම සඳහා රජයේ ක්ලවුඩ් පද්ධතිය (LGC) තුළ පද්ධතිය සඳහා සත්කාරකත්වය ලබා දීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, 2022 වර්ෂයේ මැද භාගය වන විට, LGC 2.0 සම්පත් භාවිතය එහි උපරිම මට්ටමට ළඟා වීම හේතුවෙන්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සහ ICTA අතර අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි MIS පද්ධතිය සඳහා LGC සත්කාරකත්වය සැපයීමට එකඟවූ ICTA හට නොහැකි විය. රටේ පැවති පෙර නොවූ විරූ ආර්ථික අර්බුදය මධ්‍යයේ රට තුළ පැවති සැපයුම් දාම ගැටළු හේතුවෙන් ICTA හට ඔවුන්ගේ සම්පත් පුළුල් කිරීමට නොහැකි විය. එබැවින්, අවශ්‍ය සේවාදායක පහසුකම් නොමැති වීම හේතුවෙන්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි MIS ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් දක්වා මන්දගාමී ප්‍රගතියක් පිළිඹිබු කරන ලදී.

මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සහ ICTA අතර පැවැත් වූ සාකච්ඡා කිහිපයකින් පසුව, 2022 සැප්තැම්බර් මාසයේදී, ICTA විසින් අවශ්‍ය සේවාදායක පහසුකම් ක්‍රමයෙන් වැඩි වන ආකාරයට සැපයීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි MIS ව්‍යාපෘතිය 2022 නොවැම්බර් මාසයේ සිට නවීකරණය කරන ලද අතර, සංශෝධිත ව්‍යාපෘති කාලසීමාවට අනුව ක්‍රමානුකූලව ප්‍රගතියක් ලබමින් පැවතුණි.

2022 වර්ෂයේ අවසාන කාර්තුවේදී, MIS හි මූලික නොවන මොඩියුලවල සවිස්තරාත්මක මෘදුකාංග පිරිවිතර අවශ්‍යතා සමාලෝචනය සම්පූර්ණ කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයට හැකි විය. මෙම ක්‍රියාවලියේදී, පුහුණු ශ්‍රමික සංක්‍රමණය හේතුවෙන් මෘදුකාංග සංවර්ධකයා මුහුණ දෙන ප්‍රායෝගික දුෂ්කරතා ඉස්මතු කරමින් 2023 මාර්තු 31 දක්වා ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කරන ලෙස මෘදුකාංග සංවර්ධකයා විසින් කරන ලද ඉල්ලීම පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සාකච්ඡා පවත්වන ලදී.

12. මූල්‍ය වාර්තාකරණ පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබා දීම

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලය විසින් නියාමන යාන්ත්‍රණය පිළිබඳව මෙන්ම නියාමන පරිසර පද්ධතිය ශක්තිමත් කිරීමේ අරමුණින් යුක්තව අනුකූල වීමේ අවශ්‍යතා පිළිබඳව ආයතනවල සහ විගණකවරුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම පිළිබඳව ද දරන ලද ප්‍රයත්නයේ දී පහත දක්වා ඇති පියවර ගෙන තිබුණි.

- පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ දැනුවත්භාවය කාලීනව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් දරන ලද ප්‍රයත්නයට අනුකූල වන පරිදි, 2021 වසරේ සිදු කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල සොයාගැනීම් සහ විගණන පරීක්ෂා පිළිබඳ වාර්තාවක් 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන්නන් සහ විගණකවරුන් වෙත නිකුත් කිරීම.
- සම්බන්ධිත පාර්ශ්වවලට (Related Parties) අදාළ තෝමාත්මක විගණන පරීක්ෂණ වාර්තාව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය, විගණන කමිටු, හා විගණකවරුන් වෙත නිකුත් කිරීම සහ එම වාර්තාව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.
- බැංකු, රක්ෂණ සමාගම්, දේපළ වෙළඳාම් අංශයේ සහ හෝටල් අංශයේ ලැයිස්තුගත ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමාලෝචන අතරින් ඉකුත් වර්ෂයේ සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.
- වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස. මණ්ඩලයේ වෙත නියමිත වේලාවට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත නිවේදනය කිරීම.
- දැනුම බෙදාගැනීම සම්බන්ධව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ඉටු කරනු ලබන කාර්යයේ කොටසක් වශයෙන් කැළණි විශ්වවිද්‍යාලයේ ගණකාධිකාරී දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ගිණුම්කරණ පර්යේෂකයන් සහ අධ්‍යාපනඥයින් සඳහා වූ 8 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී (ICARE) කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම.

2022 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

1. දළ විශ්ලේෂණය

වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) අබණ්ඩව අධීක්ෂණය කරයි. එකී කාර්යය ඉටු කිරීමේදී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) විසින් රටේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීමේ දී, අදාළ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් පෙළඹවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි.

2. ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) විසින් මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීම

වර්ෂය තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 534ක් නියෝජනය කරමින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 541ක සමාලෝචන කටයුතු සම්පූර්ණ කරන ලදී. සම්පූර්ණ කරන ලද සමාලෝචන වලට අවදානම් පාදක වූ නිර්ණායක මත තෝරාගත් මූල්‍ය ප්‍රකාශන ඇතුළත් වූ අතර, වසර තුළ සම්පූර්ණ කරන ලද සමාලෝචන අතරින් කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති ආයතනවල සමාලෝචන වලින් 95% ක් සහ නියාමනය කරන ලද ආයතනවල සමාලෝචන වලින් 78% ක් නියෝජනය කෙරේ.

මෙම ක්‍රියාවලියේදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්, පනතේ දක්වා ඇති සියලුම කාණ්ඩ නියෝජනය වන බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගනු ලැබූ අතර ප්‍රායෝගිකව හැකි තාක් දුරට පුද්ගලික ආයතන වන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලින් චක්‍රීය ආවරණයක් සිදු කරන ලදී.

3. අධීක්ෂණය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම

2021 වර්ෂයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එවකට අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රමවේදය සමාලෝචනය කිරීමට සහ ගෝලීය හොඳම භාවිතයන් සමඟ සමපාත වෙමින්, සමාලෝචන ආවරණය ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සඳහා සිදු කළ යුතු වෙනස්කම් නිර්දේශ කිරීමට විදේශීය උපදේශකවරයෙකු සම්බන්ධ කර ගන්නා ලදී.

උපදේශකවරයාගේ නිර්දේශ මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම සඳහා අහඹු සහ චක්‍රීය ප්‍රවේශයන් සහිත අවදානම් පාදක ප්‍රවේශයක් ඒකාබද්ධ කරමින් මිශ්‍ර ආකෘතියක් අනුග මනය කරන ලදී. වර්ෂය තුළ අවදානම් මත පාදක වූ ප්‍රවේශය යටතේ, කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම්ව, කලින් තීරණය කරන ලද තේමා මත සමාලෝචන පවත්වන ලදී.

තවද, ඉහත සඳහන් කර්මාන්ත කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක වලට යටත් නොවන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තෝරාගනු ලබන්නේ චක්‍රීය ආවරණයක් සිදු කරන ආකාරයට අහඹු පදනමක් මතය.

ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචන කාර්යයේ ප්‍රවේශයන් පහත පරිදි සිදුවේ;

- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනය
- කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම් වූ තේමා කේන්ද්‍රීය සමාලෝචනය

4. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLAS) අනුකූල වීම නිරීක්ෂණය කිරීම පිළිබඳ ප්‍රතිඵල

වසර තුළදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මක අපගමන අනාවරණය වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකකින් එකඟතාවයන් ලබා ගන්නා ලදී. ඒ අනුව, 2022 වර්ෂයේ සමාලෝචන සොයා ගැනීම් මගින් සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් 1%ක් අනුකූල නොවන බවත්, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් 63% ක් අනුකූල වන බවත්, මූල්‍ය ප්‍රකාශන වලින් 36% ක් ආධාර ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණ වලට අනුකූල වූ බවත් අනාවරණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී, අනුකූල වූ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල 7% ක වැඩිවීමක් සිදු වී ඇත. ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින්, මූල්‍ය ප්‍රකාශන කට්ටල 194 ක් සම්බන්ධයෙන් වසර තුළ කරන ලද නිරීක්ෂණ, ආධාර ලිපි මගින් සන්නිවේදනය කර ඇත.

5. අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් ලබාගත් එකඟතා සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්

5.1 එකඟතාවන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම් පිළිබඳ සොයා ගැනීම්වල ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වල පසුකාලීන මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා රාජ්‍ය සංස්ථා වන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකකින් එකඟතාවන් ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. / ශ්‍රී.ලං.ගි.ප්‍ර. යන මුල් යෙදුම් සහිත) හා අනුකූල නොවන පරිදි කටයුතු කිරීම සම්බන්ධයෙන් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙක මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට යොමු කිරීම් සහිතව එකඟතා ලබාගෙන ඇති අයිතම වර්ග පහත පරිදි වේ;

- වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමට පවතින හිමිකාර කොටස්වල ආයෝජනය වාර්තාකරණ දිනට සාධාරණ වටිනාකමට මැනීමට අසමත් වීම සහ හානිකරණ දර්ශක පවතින විට දී, හිමිකාර කොටස්වල ආයෝජනයේ සාධාරණ වටිනාකම අඩුවීම සඳහා

2022 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

ප්‍රතිපාදනයක් නොකිරීම. (යොමුව; ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 ඡේද 5.2.1 සහ 5.5.1)

- හානිකරණ දර්ශක පවතින විට, රාජ්‍ය ආයතනයකින් ලැබිය යුතු මුදල් අඩුවීම සඳහා ප්‍රතිපාදන නොකිරීම (යොමුව; ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 ඡේදය 5.5.1)

- ආයතනයට වීම ඉඩම් වලින් ආර්ථික ප්‍රතිලාභ නිපදවීම පාලනය කිරීමට, අයිතිය සහ හැකියාව ඇති විට, මූල්‍ය ප්‍රකාශනවල වීම ඉඩම් හඳුනා නොගැනීම (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 ඡේද 15)

- වත්කම් වලින් අනාගත බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි බවට කිසිදු ඇඟවීමක් නොමැති විට, බදු පාඩු හේතුවෙන් පැන නගින විලම්බිත බදු වත්කමක් හඳුනා ගැනීම මගින් වත්කම් වැඩියෙන් දැක්වීම. (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 ඡේද 34, 35 සහ 36)

- ආයතනයක් වීකාබද්ධ කර ඇති විට, වීකාබද්ධ කළ ආයතනයේ ආදායම හඳුනා ගැනීමට අපොහොසත් වීම. (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 ඡේද 15)

- මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇති ගෙවිය යුතු ශේෂ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කරන ලද ගෙවිය යුතු ශේෂ අතර ඇති වෙනස්කම් සැසඳීමට අපොහොසත් වීමෙන් දිගු කාලයක් කල් ගිය බදු වගකීම් පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු නොකිරීම. (යොමු; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 හි 10 වන ඡේදය සහ සංකල්පීය රාමු ඡේද 4.46)

5.2 නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්

කීර්තිනාමයේ හානිකරණය තීරණය කිරීමේදී, කලින් භාවිතා නොකළ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති ආයතනයකට නියාමකයා වෙත නොමඟ යවන සුළු තොරතුරු ඉදිරිපත් කිරීමේ පදනම මත ශ්‍රී.ල.හි.වි.ප්‍ර.ස.ම. මගින් අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.

2022 වර්ෂය තුළ ලබා ගත් වකඟතා සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම් පිළිබඳ විස්තර 22 හා 23 පිටුහි දක්වා ඇත.

6. ප්‍රමිතීන්ට අනුකූලවීම වැඩි දියුණු කිරීම සඳහා කරන ලද පුළුල් සමාලෝචනවල සොයා ගැනීම්

සන්නිවේදනය කරන ලද නිරීක්ෂණ

ප්‍රමාණාත්මක වූ නමුත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිත කරමින් ක්‍රියාපටිපාටි භාවිත කිරීම අවශ්‍ය නොවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම් සම්බන්ධ නිරීක්ෂණ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත සහාය ලිපි මගින් දැනුම් දෙන ලදී. එමඟින්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලට අනාගතයේ දී අනුකූලතාව වැඩි දියුණු කිරීමට කටයුතු කළ හැකිය.

ඉහත (3) හි පැහැදිලි කර ඇති පරිදි, එවැනි සමාලෝචන සිදු කිරීමේ ප්‍රවේශයන් දෙක මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් සම්බන්ධ විස්තර පහත දැක්වේ.

6.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සිදු කරන ලද පුළුල් සමාලෝචනවල සොයාගැනීම්

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත නිරීක්ෂණ සහාය ලිපි ආකාරයෙන් සන්නිවේදනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පුළුල් සමාලෝචන වල ප්‍රධාන සොයාගැනීම් පහත දක්වා ඇති පරිදි වේ.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 45 ක් විසින් ආයතනය නිරාවරණය වන මූල්‍ය උපකරණ වලින් පැනනගින අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය, සහ අපේක්ෂිත ණය අලාභවලින් පැනනගින ප්‍රමාණ පිළිබඳ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු, වාර්තාකරණ කාලසීමාව අවසානයේ ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැතිවීම - (යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 ඡේද 31 සිට 42 දක්වා)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 21 ක මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය සඳහා අදාළ වන මිනුම් පදනම් සහ අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ / හෝ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධ හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් ලෙස සිදු කර නොතිබීම.(යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 ඡේද 112 සහ 117)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 13 ක් මගින් භාවිත කරන ලද තක්සේරු ශිල්පීය ක්‍රම, තක්සේරු ක්‍රම සඳහා යෙදවුම්, භාවිතා කරන ලද සැලකිය යුතු ලෙස නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් සඳහා සිදු කරන ලද ප්‍රමාණාත්මක ගැළපීම් සහ සාධාරණ වටිනාකම්න් මනිනු ලබන වත්කම් සහ වගකීම් වලට අදාළ එක් එක් පන්තිය සඳහා සාධාරණ වටිනාකම් ධුරාවලිය ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැතිවීම. - (යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 13 ඡේද 91 සහ 93)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 12 කට අදාළ සම්බන්ධිත පාර්ශ්ව සබඳතාවල ස්වභාවයට අදාළ හෙළිදරව් කිරීම් මෙන්ම සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කර නොමැතිවීම - (යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 ඡේදය 18)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 11 කට අදාළ බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාව සහ බදු පාඩු හේතුවෙන් පැන නගින විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීමට සහාය වන සාක්ෂි ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොමැතිවීම. (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 ඡේදය 81)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 11 කට අදාළව, දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ සියලු තොරතුරු අනාවරණය කර නොමැතිවීම. (යොමුව; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 ඡේදය 77)

2022 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 10 කට අදාළව, රක්ෂණ ගිවිසුම් වලින් පැන නගින මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණයන් පැහැදිලි කරන තොරතුරු සහ රක්ෂණ ගිවිසුම් වලින් පැන නගින අවදානම් වල ස්වභාවය සහ ප්‍රමාණය තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට හැකියාව ලබා දෙන තොරතුරු ප්‍රමාණවත් ලෙස ලබා දී නොතිබීම. (යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 4 ඡේද 36 සිට 39 දක්වා)

- මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳ වෛෂයික සාක්ෂි පවතින විට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 5ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 10 ක ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් වල අපේක්ෂිත ණය පාඩු සඳහා අලාභ දීමනාව හඳුනා ගැනීමට අපොහොසත් වීම. (යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 ඡේදය 5.5.1 සහ SME වගන්තිය 11 ඡේදය 11.21)

6.2 කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම් වූ කේන්ද්‍රගත සමාලෝචන වලින් අනාවරණය කර ගත් සොයා ගැනීම්

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ පුළුල් සමාලෝචන වලට අමතරව, ශ්‍රී.ල.හි.වි.ප්‍ර.ස.ම. විසින් 2022 වර්ෂයේ දී එහි මූල්‍ය ප්‍රකාශන සමාලෝචන යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට සහ ගෝලීය හොඳම භාවිතයන් සමඟ අනුකූලවීම සඳහා තෝරා ගත් තේමා කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචන පවත්වන ලදී. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් ආවරණය වැඩි දියුණු කිරීම සඳහා මෙම සමාලෝචන වලදී සුවිශේෂී තේමා පිළිබඳව අවධානය යොමු කරන ලදී. ආයතනය සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාවය මත, සමාලෝචන අන්තර්ක්‍රියාකාරී හෝ ඩෙස්ක්ටොප් සමාලෝචන ලෙස පවත්වන ලදී.

සොයාගැනීම් සංඛ්‍යාතය මත පදනම් වූ කේන්ද්‍රගත සමාලෝචනවල සොයාගැනීම් පහත පරිදි වේ.

2022 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

කේන්ද්‍රගත ක්ෂේත්‍රය	අනුකූල නොවීමේ ස්වභාවය	ප්‍රමිතිය සඳහා යොමුව
SLFRS 7 මූල්‍ය උපකරණවල අවශ්‍යතාවට අනුව අවදානම් හෙළිදරව් කිරීම්: මූල්‍ය සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීම්	නැවත සාකච්ඡා කරන ලද හෝ වෙනස් කරන ලද මූල්‍ය වත්කම් සහ ඒවායේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 අවශ්‍යතා වලට අදාළ වන පරිදි සකස් කර නොතිබුණි.	ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 ඡේදය 35 (F) (f)
	මූල්‍ය උපකරණවල දළ ධාරණ ප්‍රමාණය අලාභ ප්‍රතිපාදන වල වෙනස්වීම් වලට දායක වී ඇති කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති වෙනස්කම් වල විදගත්කම පැහැදිලි කර නොතිබුණි.	ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 ඡේදය 35 (F) (l)
	විවිධ මූල්‍ය උපකරණ සඳහා පැහැර හැරීම යන්නට ආයතනය විසින් ලබා දී ඇති අර්ථ දැක්වීම සහ එම අර්ථ දැක්වීම තෝරා ගැනීමට හේතුව පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.	ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 ඡේදය 35 (F) (b)
	බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වලට යටත්ව ලියා හරින ලද මූල්‍ය වත්කම් සඳහා නොගෙවූ කොන්ත්‍රාත්තු මුදල් ප්‍රමාණ හෙළිදරව් කර නොතිබුණි.	ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 ඡේදය 35 (L)
LKAS 36 අදාළ කර ගැනීම, ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හානිකරණය	මුළු කීර්තිනාමයට සාපේක්ෂව, විදගත් කීර්තිනාමය සහිත මුදල් උත්පාදන ඒකක / කණ්ඩායමට අදාළ හෙළිදරව් කිරීම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සිදු කර නොතිබුණි.	
	ප්‍රධාන උපකල්පන වලට පවරා ඇති අගය (න්) තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වයේ ප්‍රවේශය පිළිබඳ විස්තරයක්	ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 ඡේදය 134 (D) (ii)
	වසර 5 කට වඩා දීර්ඝ කාලයක් සඳහා මුදල් ප්‍රවාහයන් ප්‍රක්ෂේපණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලබන කාලසීමාව	ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 ඡේදය 134 (d) (iii)
	මෑතකාලීන අයවැය/අනාවැකි මගින් ආවරණය කරන ලද කාලසීමාවෙන් ඔබ්බට මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණය බහිර්නිවේශනය සඳහා භාවිතා කරන වර්ධන වේගය සහ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපන සඳහා දිගුකාලීන සාමාන්‍ය වර්ධනය ඉක්මවීම සාධාරණීකරණය කිරීම	ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 ඡේදය 134 (d) (ii)
ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15, ගනුදෙනුකරුවන් සමඟ ඇති කර ගත් ගිවිසුම්වලින් ලැබෙන ආදායම අදාළ කර ගැනීම	ගනුදෙනුකරුවන් සමඟ ඇති කර ගත් ගිවිසුම්වල කාර්යසාධන වගකීම් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති කරුණු වලට අදාළව ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබුණි; • කාර්යසාධන වගකීම් දර්ශ්‍රීය වශයෙන් ඉටු වූ අවස්ථා පිළිබඳ විස්තර • වැදගත් ගෙවීම් කොන්දේසි • පොරොන්දු වූ භාණ්ඩ / සේවාවල ස්වභාවය ප්‍රතිලාභ / ආපසු ගෙවීමේ වගකීම් • වගකීම් වර්ග	ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 ඡේදය 119

2022 වර්ෂය තුළදී ලබා ගත් ඒකඟතා සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්

අ). ලබා ගත් ඒකඟතා

1. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

i. හිමිකාර කොටස්වල සාධාරණ වටිනාකම

2020 දෙසැම්බර් 31 දිනට ලංකා සිමෙන්ට් පීඑල්සී හි හිමිකාර කොටස් වල ආයෝජනයේ සාධාරණ වටිනාකමේ අඩුවීමක් පෙන්නුම් කරන අවස්ථාවේ දී, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් 2020 දෙසැම්බර් 31 දිනට සාධාරණ වටිනාකමේ වෙනස්වීම් හඳුනා නොගෙන, 2014 දෙසැම්බර් 31 දිනට තිබූ සාධාරණ වටිනාකම අඛණ්ඩව පිළිබිඹු කර ඇත. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් 2020 දෙසැම්බර් 31 දිනට කොටස්වල සිදු කරන ලද ආයෝජනවල වටිනාකම වැඩියෙන් දැක්වීමට මෙය හේතු වී ඇත.

එහි විගණකවරුන් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර නොතිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් සිදු කරන ලද විමසීම් වලින් පසුව, ලංකා සිමෙන්ට් පීඑල්සී හි හිමිකාර කොටස්වල සිදු කරන ලද ආයෝජනය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල එහි සාධාරණ වටිනාකමින් පිළිබිඹු කිරීමට සංස්ථාව එකඟ විය.

ii. ඉඩම් හඳුනාගැනීම

සීමාසහිත පුත්තලම සිමෙන්ති (පෞද්.) සමාගමට බදු දී ඇති අක්කර 5,413 ක භූමි ප්‍රමාණයේ මෙන්ම කන්කසන්තුරේ පිහිටි අක්කර 751 ක ඉඩම් වලින් ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පාලනය, අයිතිය සහ විභවය සතු ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව මගින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල එකී ඉඩම් හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිය වත්කම් අඩුවෙන් සඳහන් කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

විගණකවරුන් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර නොතිබුණි.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල ඉහත ඉඩම් හඳුනාගැනීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් සංස්ථාවෙන් ඒකඟතාවක් අපේක්ෂා කළ ද, තක්සේරු කිරීම හා සම්බන්ධ පිරිවැය හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන වල එම ඉඩම් හඳුනා ගැනීමට සංස්ථාව එකඟ වී නොතිබුණි. එයට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා වලට අනුකූල වීම සඳහා සංස්ථාව මගින් මූල්‍ය ප්‍රකාශනවල එකී ඉඩම් හඳුනාගැනීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ඉල්ලා සිටින ලදි.

2 ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

i. බදු පාඩු මත විලම්භිත බදු වත්කම්

සංස්ථාව අඛණ්ඩව පාඩු ලබමින් සිටින අවස්ථාවක සහ බදු අය කළ හැකි තාවකාලික වෙනස රු. මිලියන 154 පමණක් වූ අවස්ථාවක, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය LKAS 12, ආදායම් බදු ප්‍රකාරව, බදු අය කළ හැකි අනාගත ලාභ ලැබිය හැකි බව තක්සේරු නොකර, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු වී ඇති බදු පාඩුව වූ රු. බිලියන 3.1 කට අදාළව, රු. මිලියන 879 ක් වූ විලම්භිත බදු වත්කමක් හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වත්කම් හා රඳවා ගත් ඉපයීම් රු. මිලියන 879 කින් වැඩියෙන් දක්වා තිබුණි.

විගණකවරුන් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර නොතිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් සිදු කරන ලද විමසීම් වලින් පසුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල අයකරගත හැකි ප්‍රමාණවලින් විලම්භිත බදු වත්කම් පිළිබිඹු කිරීමට සංස්ථාව එකඟ විය.

ii. ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම ඒකාබද්ධ කිරීම

අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ ස්ථාපනය කර ඇති ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානයේ (NEMO) ව්‍යාපෘති 62කට අදාල වූ රු. බිලියන 1.176 ක ආදායම (NEMO) හි ලාභ ගණනය කිරීම්වලින් ඉවත් කර තිබූ අතර, එහි මූල්‍ය ප්‍රකාශන, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඇත. මෙම හේතුව මත සංස්ථාව මගින් වර්ෂය සඳහා ඔවුන්ගේ රඳවා ගත් ඉපැයීම් අඩුවෙන් පිළිබිඹු කර තිබේ.

විගණකවරුන් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර තිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් සිදු කරන ලද විමසීම්වලින් පසුව, 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල (NEMO) හි සියලුම ව්‍යාපෘතිවල ආදායම ඒකාබද්ධ කිරීමට සංස්ථාව එකඟ විය.

iii. අඩමාන ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය LKAS 39, මූල්‍ය උපකරණ: පිළිග ැනීම සහ මැනීමෙහි අවශ්‍යතා අනුව, වසර 3කට අධික කාලයක් පුරා හිඟව පවතින රු. බිලියන 1.2ක් වූ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු මුදල් සඳහා කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කර නොමැත. මෙම හේතුව මත සංස්ථාව විසින් වර්ෂය සඳහා වත්කම් සහ රඳවා ගත් ඉපැයීම් වැඩියෙන් දක්වා ඇත.

විගණකවරුන් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර තිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කරන ලද විමසීම් වලින් පසුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල හානිකරණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන හඳුනා ගැනීමට සංස්ථාව එකඟ වී තිබේ.

iv. ගෙවිය යුතු ශේෂ පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුව

මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගත් රු. මිලියන 887ක් වූ ගෙවිය යුතු ශේෂය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් තහවුරු කරන ලද රු. මිලියන 3.1 ක් වූ ගෙවිය යුතු ශේෂය අතර වෙනස නොසැසඳීම මගින් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟව පැවති එකතු කළ අගය මත බදු,

2022 වර්ෂය තුළදී ලබා ගත් එකඟතා සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්

භාණ්ඩ හා සේවා බදු සහ ජාතික ආරක්ෂක බදු සඳහා ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු විය හැකි බලපෑම මෙම අවස්ථාවේදී නිශ්චය කළ නොහැකිය.

විගණකවරුන් විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර තිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කරන ලද විමසීම්වලින් පසුව, ගෙවිය යුතු ශේෂ සැසඳීම සඳහා ද, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගිණුම් සටහන් (Accounting Entries) වාර්තා කිරීමට ද සංස්ථාව එකඟ විය.

ආ. නිකුත් කරන ලද අනතුරු හැඟවීම්

පෑන්වීෂියන් පවර් පීවල්සී

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කීර්ති නාමය හානිකරණය විම නිර්ණය කිරීම සඳහා පෑන්වීෂියන් පවර් පීවල්සී විසින් භාවිත අගය (Value in use) උපයෝගී කර ගැනීම පිළිබඳව අනාවරණය කර ඇති අතර, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කීර්ති නාමය හානිකරණය කිරීම සඳහා ප්‍රතිපාදන සලසා නොමැතිවීම සම්බන්ධයෙන් හේතු විමසීමේ දී, හානිකරණ පරීක්ෂාවට බලපෑමක් සිදු කළ මුදල් උත්පාදන ඒකකයේ අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා සාධාරණ වටිනාකමෙන් විකිණුම් පිරිවැය අඩු කළ වටිනාකම (FVLCS) භාවිත කර ඇති බව සමාගම විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කීර්තිනාමයේ හානිකරණය තීරණය කිරීම සඳහා පූර්වයෙන් භාවිත නොකළ තොරතුරු සමාගම විසින් ඉදිරිපත් කර ඇති බැවින්, සමාගම විසින් නොමඟ යවන සුළු තොරතුරු නියාමකය වෙත ඉදිරිපත් කිරීම 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත උල්ලංඝනය කිරීමක් බවට මණ්ඩලය විසින් සමාගම වෙත අනතුරු ඇඟ වීමක් නිකුත් කරන ලදී.

2022 වර්ෂයේ විගණන පරීක්ෂණවල සොයාගැනීම්

1. දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණකවරුන් විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuS) වලට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමේ කාර්යය අබණ්ඩව සිදු කරන ලදී. දිවයින තුළ විගණනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ සමස්ත අරමුණින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණන පරීක්ෂණ සිදු කරනු ලබයි. එසේ කිරීමේදී, අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මෙන්ම අහඹු තේරීම් ප්‍රවේශයක් පිළිබඳව සලකා බලා පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගනු ලැබේ.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් 2022 වර්ෂයේ පළමු භාගය තුළ තීව්‍ර වූ අවිනිශ්චිතතාවන්ට මුහුණ දුන් ශ්‍රී ලංකා ආර්ථිකය සැලකිල්ලට ගනිමින්, ව්‍යාපාරවල මෙහෙයුම් පරිසරය කෙරෙහි එහි බලපෑම හඳුනා ගැනීම සම්බන්ධයෙන් මෙන්ම ආයතනවල විනිශ්චයන්වල සහ ඇස්තමේන්තු කිරීමේ සැලකිය යුතු අවිනිශ්චිතතාවයන්ට හේතු වූ සාර්ව ව්‍යාපාරික හා ක්ෂුද්‍ර ව්‍යාපාරික පරිසරයන්හි ඇති ඉහළ මට්ටමේ අවිනිශ්චිතතා සහ ගතික වෙනස්කම් පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෑත අතීතය තුළ පැවති මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීමේ අවිනිශ්චිතතාවයන් මගින් ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම හා සම්බන්ධ අවදානම් තුළින් සමස්ත විගණන අවදානම වැඩි කර ඇත. මෙම අභියෝග හේතුවෙන් විගණකවරුන්ට ස්වකීය ප්‍රවේශයන් සම්බන්ධයෙන් වඩාත් සැකමුසුභාවයෙන් කටයුතු කිරීම සහ සැලකිය යුතු ප්‍රමාණයක වෘත්තීය විනිශ්චයක් ක්‍රියාත්මක කිරීම සහ විගණන සිදු කිරීමේදී සදාචාරාත්මක වගකීම් කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වී ඇත.

ඒ අනුව, වර්ෂය තුළ පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගැනීම, අවදානම් මත පදනම් වූ ප්‍රවේශය අහඹු නියැදීම සහ චක්‍රීය ප්‍රවේශයන් සමඟ ඒකාබද්ධ කරන ලද මිශ්‍ර ආකෘතියක් මත පදනම් විය. අහඹු නියැදීම් ප්‍රවේශය තුළ ජාත්‍යන්තර වශයෙන් ජාලගත විගණකවරුන් සහ මධ්‍යම මට්ටමේ විගණකවරුන් හැර වෙනත් විගණකවරුන් තෝරාගෙන නොතිබුණු අවස්ථාවල එවැනි විගණකවරුන් චක්‍රීය ප්‍රවේශය තුළින් තෝරා ගැනීම සම්බන්ධයෙන් සලකා බලන ලදී.

මෙම අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් භාවිත කරමින් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විගණන පරීක්ෂණ සිදු කර ඇත.

- වංචා අවදානම් හඳුනා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම - ආර්ථික පසුබෑම මධ්‍යයේ හිතකර මූල්‍ය ප්‍රතිඵල පිළිබිඹු කිරීම වෙනුවෙන් කළමනාකාරිත්වය මුහුණ දෙන පීඩනය හේතුවෙන් පැන නගින වංචා අවදානම
- ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම - ආර්ථික පසුබෑම පිළිබඳ ආවේනික අවදානම හේතුවෙන් ආදායම් හඳුනාගැනීම පිළිබඳ SLFRS 15 හා සම්බන්ධ ඉහළ මට්ටමේ වෘත්තීය විනිශ්චය මගින් වංචා කිරීමේ අවදානම වැඩි කළ හැකිය.
- මූල්‍ය සමාගම්වල මූල්‍ය වත්කම් හානිකරණයට අදාළ ගිණුම්කරණ ඇස්තමේන්තු - මූල්‍ය වත්කම් හානිකරණය තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වන අතර ඒවායේ ඉතා අවිනිශ්චිත ස්වභාවය සහ භාවිතා කරන ලද ආකෘති, දත්ත සහ උපකල්පනවල ඇති සංකීර්ණතා මගින් හානිකරණ ප්‍රතිපාදන අඩුවෙන් දැක්වීමට අදාළව විගණකවරුන්ට ප්‍රායෝගික අභියෝග මතු විය හැකිය.
- බැංකුවල ණය හා අත්තිකාරම්වල හානිකරණය පිළිබඳ තනි පුද්ගල තක්සේරුව සම්බන්ධයෙන් ගිණුම්කරණ ඇස්තමේන්තු - රටේ ආර්ථික පසුබෑම බොහෝ ණය ගැණුම්කරුවන්ට බලපා ඇති අතර ව්‍යතිරේකයකින් තොරව මහා පරිමාණ ආයතනික ණය ගැණුම්කරුවන් ද හානිකරණ ඇඟවීම් පිළිඹිබු කළ හැකි අතර වාරික ආපසු ගෙවීමේ මුදල් ප්‍රවාහයේ ඇති විය හැකි ප්‍රමාදයන් පෞද්ගලිකව සැලකිය යුතු ගනුදෙනුකරුවන්ගේ හානිකරණ තක්සේරු සම්බන්ධයෙන් සෘජු බලපෑමක් සිදු කරයි.

ඉහත දක්වා ඇති විගණන පරීක්ෂණවල කේන්ද්‍රීය ක්ෂේත්‍රවලට අමතරව, මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී විගණකවරුන් විසින් ක්‍රියාත්මක කරන වෘත්තීය විනිශ්චය සහ සැකමුසුභාවය තක්සේරු කිරීම සඳහා ඇතැම් විගණන පරීක්ෂණ සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් SLFRS / LKAS සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක වශයෙන් අනුකූල නොවන අවස්ථා හඳුනාගෙන ඇති විගණනවලදී මෙම අංශය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී.

2. අබණ්ඩ විගණන පරීක්ෂණ

ඉකුත් වර්ෂයේ විගණන ආයතන 17 ක් විසින් සිදු කරන ලද විගණන කටයුතු 34 හා සැසඳීමේ දී, මෙම වර්ෂය තුළදී, විගණන ආයතන 9 ක් විසින් සිදු කරන ලද විගණන කටයුතු 33 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. වර්ෂය තුළ ඉල්ලා අස්වීමක් හේතුවෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි සිටින පරීක්ෂණ කාර්ය මණ්ඩලය අඩුවීම පරීක්ෂණ සංඛ්‍යාව අඩුවීමට හේතු විය.

වර්ෂය තුළ පරීක්ෂා කරන ලද විගණනවලට ජාත්‍යන්තර ජාලවල සාමාජිකයන් වන විගණන ආයතන 5ක් විසින් සිදු කරන ලද විගණන 27ක් ඇතුළත් විය.

3. බලාත්මක කිරීම

3.1. බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණය

විගණන පරීක්ෂා කිරීම් වලදී සිදු කරන ලද නිරීක්ෂණවල ප්‍රබලතාව මත පදනම්ව, ශ්‍රී ලංකාවේ විගණන තත්ත්ව පරිසරය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා විගණකවරුන් වැඩිදියුණු කර ගැනීමේ ප්‍රයත්නයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. නිත්‍ය විගණන පරීක්ෂණ වලදී ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන SLAuSs සමඟ අනුකූල නොවීම් නිරීක්ෂණය වූ අවස්ථාවල දී, එවැනි අඩුපාඩු "නිරීක්ෂණ ලිපි" වශයෙන් හඳුන්වන සහායක ලිපියක් මගින් විගණන ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. විගණනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩිදියුණු කිරීම් සිදු කිරීම අවශ්‍ය වූ අවස්ථාවල දී, එවැනි වැඩිදියුණු කිරීම් "වැඩිදියුණු කිරීම සඳහා යෝජනා" ලෙස සන්නිවේදනය කෙරේ. මීට අමතරව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණනයක් පැවැත්වීමේදී, මූලික සදාචාරාත්මක මූලධර්ම ක්‍රියාත්මක කිරීමට විගණකවරයා අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වූ අවස්ථාවල දී, එම සමාගම අනාගතයේදී මූල්‍ය ප්‍රකාශන විගණනය කරන විට , අදාළ විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතා වලට අනුකූලව අනලස්ව කටයුතු

2022 වර්ෂයේ විගණන පරීක්ෂණවල සොයාගැනීම්

කළ යුතු බවට නියම කරමින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව විගණන ආයතනයට අනතුරු ඇඟවීමේ ලිපියක් (Letter of Warning) නිකුත් කරනු ලැබේ. තවද, ගැටළුවල වැදගත්කම මත පදනම්ව, අවශ්‍ය අවස්ථාවලදී, ශ්‍රී.ල.හි.වි.ප්‍ර.ස.ම. විසින් විගණන ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් සම්බන්ධ උපදෙස් සඳහා නීතිපතිවරයා වෙත යොමු කරන අතර, විගණන ගුණාත්මකභාවයේ අඩුපාඩු පවතින විට, එවැනි කරුණු සම්බන්ධ බලපත්‍ර අධිකාරිය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත සහ අදාළ වන පරිදි විගණකවරුන් සහ විගණනය කරනු ලබන ආයතනය පාලනය කරන වෙනත් ඕනෑම නියාමකයෙකුට යොමු කරනු ලැබේ.

3.2. වර්ෂය තුළ ගන්නා ලද බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

3.2.1. අනතුරු ඇඟවීමේ ලිපිය

ලැයිස්තුගත ආයතනයක කීර්තිනාමය සම්බන්ධ වාර්ෂික හානිකරණ පරීක්ෂණය විගණනය කිරීමේදී ප්‍රමාණවත් වෘත්තීය නිපුණතාවයක් සහ නිසි සැලකිල්ලක් දැක්වීමට KPMG ආයතනය අසමත් වූ බව ශ්‍රී.ල.හි.වි.ප්‍ර.ස.ම. නිරීක්ෂණය කළ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් විගණකවරයා විසින් විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සිදු කිරීමට අසමත් වී තිබේ. ඒ අනුව, අනාගතයේ දී මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී, ප්‍රමාණවත් වෘත්තීය නිපුණතාවක් සහ නිසි සැලකිල්ලක් දක්වන ලෙස ආයතනයට අවවාද කරමින් ලිපියක් එම විගණන ආයතනය වෙත නිකුත් කරන ලදී.

3.2.2. ආධාරක ලිපිය

විගණන සිදු කිරීමේදී නිරීක්ෂණය වූ ව්‍යවස්ථාව යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන විගණන ප්‍රමිතීන්ට අනුකූල නොවීම් පිළිබඳ සොයා ගැනීම් සන්නිවේදනය කරමින් වර්ෂය තුළ, විගණන කටයුතු 9ක් සම්බන්ධයෙන් "නිරීක්ෂණ ලිපි" ලෙසින් ආධාරක ලිපි සමාගම් 5ක් වෙත නිකුත් කරන ලදී.

4. වැදගත් සොයාගැනීම්

වර්ෂය තුළ විගණකවරුන් වෙත සන්නිවේදනය කරන ලද වැදගත් සොයාගැනීම් පහත දක්වා ඇත. මෙම සොයාගැනීම් වලට 2021 වර්ෂයේදී සිදු කරන ලද, වර්ෂය තුළ නිරීක්ෂණ අවසන් කර සන්නිවේදනය කරන ලද විගණන පරීක්ෂණයක් පිළිබඳ සොයාගැනීම් ද ඇතුළත් වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් එම සොයාගැනීම් පිළිබඳව විගණකවරයා සමඟ දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමට සිදු විය.

4.1. අවදානම් තක්සේරුව

ආයතනය සහ ආයතනයේ අභ්‍යන්තර පාලනයන් ඇතුළුව එහි පරිසරය පිළිබඳ අවබෝධය තුළින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සඳහා විගණකවරයා විසින් අවදානම් තක්සේරු ක්‍රියා පටිපාටි සිදු කිරීම අවශ්‍ය වේ.

එවැනි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සිදු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු සන්නිවේදනය කරන ලදී.

- විස්තීර්ණ අවදානම් තක්සේරුවක් සිදු කර නොතිබුණි.
- ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන සම්බන්ධ අවදානම ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විගණනයට අදාළ පාලන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබාගෙන නොතිබුණි.
- ගනුදෙනු ආරම්භ කර ඇති ආකාරය, වාර්තා කර ඇති ආකාරය, සැකසීම සහ පොදු ලෙජරයට මාරු කර ඇති ආකාරය සහ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ආකාරය ඇතුළුව ආයතනය විසින් භාවිතා කරන විවිධ තොරතුරු තාක්ෂණ පද්ධති පිළිබඳව අවබෝධයක් ලබාගෙන නොතිබුණි.
- කීර්තිනාමය සම්බන්ධ හානිකරණයට අදාළව නුසුදුසු අවදානම් තක්සේරුවක් අනුගමනය කිරීම, හානිකරණය අඩුවෙන් දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා ගැනීමට අපොහොසත් වීම.
- මුළු ආදායමෙන් 50% කට දායක වූ අවස්ථාවක දී හඳුනාගත් ආදායම් ප්‍රවාහයකට අදාළව ආදායම් හඳුනා ගැනීමේ නියමිත අවස්ථාවේ යෝග්‍යතාවය තීරණය කර නොමැත.
- ආදායමට අදාළ ඉන්වොයිසි සකස් කිරීමේදී අනුමත මිල ගණන් සහ නිවැරදි ප්‍රමාණ භාවිතා කරන බව හඳුනාගෙන ඇති අදාළ පාලන මගින් තහවුරු කර නොමැත.

4.2. තක්සේරු කළ අවදානම් සඳහා විගණකවරයාගේ ප්‍රතිචාර

ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විගණකවරයා විසින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල තක්සේරු කරන ලද අවදානම විසඳීම සඳහා සුදුසු ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

තක්සේරු කළ අවදානම් සම්බන්ධයෙන් විගණකවරයාගේ ප්‍රතිචාරය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සන්නිවේදනය කරන ලදී.

- අවදානම් තක්සේරු කිරීම් සහ පාලන පරීක්ෂණ (TOCs) සිදුකිරීමේ අඩුපාඩු හේතුවෙන් පාලනයන්හි මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රමාණවත් ලෙස පරීක්ෂා කර නොමැත. තවද, වක්‍ර පාලනයන්හි අදාළත්වය ද පරීක්ෂා කර නොමැත.
- සේවාලාභීන් විසින් සමෝධානය නොකළ තොරතුරු තාක්ෂණ පද්ධති කිහිපයක් භාවිතා කර ඇති අවස්ථාවලදී, අවදානම් තක්සේරු කිරීම් සහ පාලන පරීක්ෂණ (TOCs) සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී විවිධ තොරතුරු තාක්ෂණ පද්ධතිවලට අදාළ පාලන සහ දුර්වලතා සැලකිල්ලට ගෙන නොතිබුණි.
- සමහර ඉන්වොයිසි පසුදාතම් කරමින් ආදායම හඳුනාගෙන ඇති අවස්ථාවලදී, ආදායම පිළිබඳ ප්‍රමාණවත් වැඩිදුර විගණන ක්‍රියාපටිපාටි සිදු කර නොතිබුණි.
- විගණකවරයා පාලන ප්‍රවේශය අනුගමනය කළද, ආදායම් සම්බන්ධ කළමනාකාරිත්වයේ ප්‍රකාශයන් තහවුරු කිරීම සඳහා වැරදි සිදු වීමේ (WCGW) හැකියාව සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති ප්‍රමාණවත් පාලන සංඛ්‍යාවක් පරීක්ෂා කිරීම සහ වලංගු කිරීම සිදු කර නොතිබුණි.

4.3. විගණන මතය

පහත සඳහන් අවස්ථාවලදී සුදුසු විගණන මතයක් ප්‍රකාශ කර නොතිබුණි;

2022 වර්ෂයේ විගණන පරීක්ෂණවල සොයාගැනීම්

- LKAS 36, වත්කම් හානිකරණ අවශ්‍යතා සමඟ වැදගත් අනුකූල නොවීම් හඳුනා ගැනීමට අපොහොසත් වීමෙන්, කීර්තිනාමයේ ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ගණනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විකරණය කළ මතයක් ප්‍රකාශ කළ යුතු වූ අවස්ථාවක විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කර ඇත.
- සමස්ථ ආදායමෙන් 50%ක් නියෝජනය කරන කාලවකවානුවක හඳුනාගත් ආදායමට අදාළ ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගෙන නොතිබුණු අවස්ථාවක, විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කිරීම.

4.4 විගණන නියැදීම

විගණකවරයා විසින් විගණන නියැදි භාවිතා කිරීමට තීරණය කර ඇති විට, එවැනි නියැදීමක් මගින් විගණකවරයාට ජනගහනය පිළිබඳ නිගමනවලට එළඹීමට සාධාරණ පදනමක් සැපයිය යුතුය.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දක්වා ඇති පරිදි වේ;

- ජනගහනය ඉහළම ආදායමක් ඇති මාසවලට සීමා කර තිබූ බැවින්, සියලුම නියැදීම් ඒකකවලට තෝරා ගැනීම සඳහා සමාන අවස්ථාවක් ලබා දී නොතිබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් විගණකවරයා නියැදීම තුළින් පරීක්ෂා නොකළ දත්ත සමුදායක් මත නිගමනවලට එළඹී තිබුණි.
- විගණකවරයා විසින් නියැදීම භාවිතා කරන අවස්ථාවේ, නියැදීම තීරණය කිරීමේ පදනම සහ උදාහරණ සම්බන්ධයෙන් SLAuS 530 හි උපග්‍රන්ථ 1, 2 සහ 3 හි දක්වා ඇති සාධක පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වා නොතිබුණි.

4.5 ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම

විගණකවරයා විසින් අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවේ සන්දර්භය තුළ, මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම් සාධාරණද යන්න පිළිබඳව ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම අවශ්‍ය වේ.

ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළව ප්‍රමාණවත් විගණන ක්‍රියාපටිපාටි සිදු කිරීමට විගණකවරයා අසමත් වූ අවස්ථා පහත දක්වා ඇති පරිදි වේ;

- කීර්තිනාමයේ හානිකරණය තක්සේරු කිරීමේදී නුසුදුසු ක්‍රම, දත්ත සහ උපකල්පන භාවිතා කිරීම තුළින් පිළිබිඹු වන කළමනාකරණ පක්ෂග්‍රාහීත්වයේ සම්භාවිතාව සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවයේ සම්භාවිතාව ප්‍රමාණවත් ලෙස තක්සේරු නොකිරීම සහ ඒ අනුව, හානිකරණය තක්සේරු කිරීමේදී භාවිතා කරන ක්‍රමය, දත්ත සහ උපකල්පනවල යෝග්‍යතාවය තක්සේරු නොකිරීම.
- සාධාරණ වටිනාකම් ඇස්තමේන්තුවල යෙදවුම් ඇගයීමට ලක් කිරීමේදී සම්බන්ධිත පාර්ශ්ව අතර සිදු වන ගනුදෙනු මගින් ලැබෙන තොරතුරු භාවිතා කිරීමේ යෝග්‍යතාවය සැලකිල්ලට නොගැනීම.
- සාධාරණ වටිනාකම් ගණනය කිරීමේ දී, කළමනාකාරිත්වයේ ප්‍රවීණතාව තුළින් භාවිත කරන ලද වෙළඳපොළ ගනුදෙනුවල සාධාරණත්වය සහ එවැනි ගනුදෙනු සඳහා ගැළපීම් පරීක්ෂා කර නොතිබුණි.
- බදු ඉඩමක් සින්නක්කර ඉඩමක් ලෙස සැලකීමේ සාධාරණත්වය තක්සේරු නොකිරීම සහ සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු මත බදු ගිවිසුමේ කොන්දේසි වලට සිදු වන බලපෑම ඇගයීමට ලක් නොකිරීම.
- විගණකවරයා විසින් සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු ඇගයීමේ දී භාවිතා කර ඇති තොරතුරු ලබා ගන්නා ලද බාහිර තොරතුරු මූලාශ්‍රවල විශ්වසනීයත්වය තක්සේරු කර නොතිබුණි.
- හානිකරණ ඇස්තමේන්තුවලට අදාළ පැහැර හැරීමේ සම්භාවිතාව සඳහා සලකා බලන ලද වයස්ගත වීමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා විගණන ක්‍රියාපටිපාටි සිදු නොකිරීම.
- අලාභ ලබා දී ඇති පෙරනිමි අනුපාතය ගණනය කිරීමේ නිරවද්‍යතාවය තක්සේරු නොකිරීම සහ අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවේ මිනුම් අරමුණු අනුව කළමනාකරණය විසින් භාවිතා කරන ලද උපකල්පන සාධාරණ ද යන්න ඇගයීමට ලක් නොකිරීම.

4.6. ප්‍රධාන විගණන කරුණු (KAM)

විගණකවරයා විසින් විගණනයේ ප්‍රධාන විගණන කරුණු (KAMs) තීරණය කිරීම අවශ්‍ය වන අතර විගණක වාර්තාවේ යෝග්‍ය ලෙස විස්තර කිරීම මගින් එම කරුණු සන්නිවේදනය කළ යුතුය.

කාරණයට වඩාත්ම අදාළ වන හෝ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ තක්සේරු අවදානමට සුවිශේෂී වූ විගණකවරයාගේ ප්‍රතිචාරය හෝ ප්‍රවේශය සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන ලද අඩුපාඩු සහ ප්‍රධාන විගණන කරුණු (KAM) සම්බන්ධයෙන් සිදු කරන ලද ක්‍රියාපටිපාටි පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයක පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ.

- තක්සේරු කළ අවදානමට ප්‍රතිචාර සැලසුම් කිරීමේදී, ආදායම ප්‍රධාන විගණන කරුණක් (KAM) ලෙස සැලකීමට අදාල අවදානම් සාධක සැලකීමට ප්‍රමාණවත් ලෙස සලකා බැලීමක් කර නොමැත.
- ප්‍රධාන විගණන කරුණු (KAMs) යටතේ දක්වා ඇති විගණන පටිපාටිවලින් සැලකිය යුතු කොටසක් ඉටු කිරීමට විගණකවරයා අසමත් වී තිබීම.
- ප්‍රධාන විගණන කරුණුවල (KAMs) නොමඟ යවන සුළු තොරතුරු ඇතුළත් කිරීම.

5. වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා

විගණනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්, මෙම වර්ෂය තුළ විගණන ආයතන තුනක විගණන කටයුතු පහක් සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම් සම්බන්ධ යෝජනා සන්නිවේදන කර ඇත. අනාගතයේදී විගණන කටයුතු සිදු කිරීමේදී මෙම යෝජනා අනුව වැඩිදියුණු කිරීම් සිදු කිරීමට විගණකවරයා ගෙන් අපේක්ෂා කරේ.

සන්නිවේදනය කරන ලද වැඩිදියුණු කිරීම් සම්බන්ධ යෝජනාවලට පහත සඳහන් කරුණු ඇතුළත් විය;

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා අනුව විගණකවරයාගේ නිගමන පිළිබිඹු කිරීම සඳහා විගණන ප්‍රලේඛනය ප්‍රමාණවත් අන්දමින් පවත්වාගෙන යාම.
- මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනු වර්ග, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් අවබෝධ කර ගැනීම සඳහා එහි ක්‍රියාකාරකම් ඇතුළුව ආයතනයේ ස්වභාවය පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගැනීම.

2022 වර්ෂයේ විගණන පරීක්ෂණවල සොයාගැනීම්

6 විගණනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ගන්නා ලද අනෙකුත් ක්‍රියාමාර්ග

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීමේ ප්‍රධාන සාධකයක් වන්නේ විගණනයේ පවතින ගුණාත්මකභාවයයි. ඒ අනුව, දිවයිනේ විගණනයේ ගුණාත්මකෙභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

6.1 විගණන පරීක්ෂණවල සොයාගැනීම් විගණන කමිටු වෙත සන්නිවේදනය කිරීම

විගණන කමිටුව පාලනයට සම්බන්ධ පාර්ශ්වයන්ගේ කොටසක් වන අතර, ආයතනයේ උපායමාර්ගික දිශාව සහ ආයතනයේ වගවීම සම්බන්ධ වගකීම් අධීක්ෂණය කිරීමේ වගකීම විගණන කමිටුවට පැවරී ඇත. ඒ අනුව, සමාගම මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ විගණකවරයා සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් විගණන කමිටුව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

මූල්‍ය වාර්තාකරණයේ සහ විගණන පරිසරයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පාලනය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වය වශයෙන් විගණන කමිටුවල දායකත්වය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අඛණ්ඩව හඳුනා ගනී. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය වාර්තාකරණයේ ඵලදායී අධීක්ෂණය දිරිමත් කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති සමාගම්වල විගණන කමිටු සභාපතිවරුන් වෙත විගණන පරීක්ෂණවල ප්‍රතිඵල අඛණ්ඩව සන්නිවේදනය කරයි.

6.2 විගණනයේ ගුණාත්මකභාවයට සහාය වීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතා

6.2.1 ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) එහි පළමු පූර්ණ රැස්වීම පැවැත් වූ 2007 වර්ෂයේ සිට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. එහි සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි. වසර තුළ දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මාර්ගගත රැස්වීම් වශයෙන් පවත්වන ලද IFIAR රැස්වීම් වලට සහභාගී වූ අතර IFIAR හි තොරතුරු රැස් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ද දායකත්වය ලබා දුන් අතර එහි සාමාන්‍ය සමීක්ෂණවලට ද සහභාගී විය.

    මෙම SLSQM වලට අනුකූල වන තත්ත්ව කළමනාකරණ පද්ධති 2023 දෙසැම්බර් 15 වන විට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන අතර, මෙම SLSQM ys 53 - 54 ඡේදවලට අනුව, අවශ්‍ය වන තත්ත්ව කළමනාකරණ පද්ධතිය ඇගයීම 2023. දෙසැම්බර් 15 න් පසුව වසරක් ඇතුළත සිදු කිරීම අවශ්‍ය වේ.

2022 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සිදු කරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්

- SLSQM 2:
  2023 දෙසැම්බර් 15 දින හෝ ඉන් පසු ආරම්භ වන කාලසීමා සඳහා මූල්‍ය ප්‍රකාශන විගණන සහ සමාලෝචන; සහ 2023 දෙසැම්බර් 15 දින හෝ ඊට පසුව ආරම්භ වන වෙනත් සහතික කිරීම් සහ අදාළ සේවා කටයුතු.

- SLAuS 220 (සංශෝධිත): 2023 දෙසැම්බර් 15 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාලසීමා සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බලපැවැත්වේ.

- **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයකදී වංචා පිළිබඳව අධිකාරී නොවන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී: වංචා කාව - SLAuS 240 සහ අනෙකුත් - SLAuSs අතර අන්තර්ක්‍රියා**

  මෙම අධිකාරී නොවන මාර්ගෝපදේශය මගින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (SLAuS) 240, මූල්‍ය ප්‍රකාශන විගණනයකදී වංචා සම්බන්ධයෙන් විගණකගේ වගකීම් සහ විගණන කටයුතු සැලසුම් කිරීමේදී සහ සිදු කිරීමේදී සහ ඒ පිළිබඳව වාර්තා කිරීමේදී අනෙකුත් SLAuSs අතර සම්බන්ධය නිරූපණය කෙරේ. SLAuSs හි සම්පූර්ණ කට්ටලය සමඟ වර්තමානයේ දී SLAuS 240 අදාළ කර ගත යුතු ආකාරය ද එමඟින් පැහැදිලි කෙරේ.

- **විගණකවරයාගේ වාර්තාවේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ කරුණු වාර්තා කිරීම සඳහා නිතර අසනු ලබන ප්‍රශ්න (FAQ) නිකුත් කරන ලදී.**

  මෙම අධිකාරී නොවන, නිතර අසනු ලබන ප්‍රශ්න දැක්වෙන ප්‍රකාශනය මගින් විගණන වාර්තාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු වාර්තා කිරීම සම්බන්ධ ඇතැම් පොදු ප්‍රශ්න සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව පිළියෙළ කරන ලද විගණන වාර්තාවක අඛණ්ඩ පැවැත්මට අදාළ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව සහ ප්‍රධාන විගණන කරුණු ඇතුළත් අංශ සහ කරුණු අවධාරණය කරනු ලබන ඡේද භාවිත කිරීම පිළිබඳව සහ ඒවායේ අන්තර් සම්බන්ධතාවය පිළිබඳව මෙම ප්‍රකාශනය මගින් අවධානය යොමු කරයි.

- **SLAuS 315 (සංශෝධිත 2019) ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයේ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම පිළිබඳව පළමුවර ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.**

  මෙම මාර්ගෝපදේශය මගින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (SLAuS) 315 (2019 වර්ෂයේ සංශෝධිත) සඳහා සිදු කරන ලද වඩාත් සැලකිය යුතු වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කරන අතර, පාර්ශවකරුවන්ට සංශෝධිත ප්‍රමිතිය අවබෝධ කර ගැනීමට සහ ඔවුන්ගේ අභිප්‍රායට අනුව එය අදාළ කර ගැනීමට එමඟින් සහාය වනු ඇත. SLAuS 315 (2019 වර්ෂයේ සංශෝධිත) 2021 දෙසැම්බර් 15 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාලසීමා සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධයෙන් බලාත්මක වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඊපීඩී/ඒ/එස්වල්ඒඒවස්වම්බි/එෆ්ඒ/2022/14 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ජූලි 14

සභාපති

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගනන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මා වෙත ලබා දුන් මණ්ඩලයේ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශනවල සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් සාවද්‍ය ලෙස සඳහන් කර ඇත්ද යන්න සලකා බැලීමයි.

මෙම විගණකාධිපති වාර්තාවේ දිනට පෙර මා වෙත ලබා දුන් වෙනත් තොරතුරු සම්බන්ධයෙන් මා විසින් සිදු කරන ලද කාර්යය මත පදනම් වෙමින් මෙම අනෙකුත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතුළත් කර ඇති බව මා විසින් නිගමනය කළහොත්, එම කරුණ මා විසින් වාර්තා කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මට කිසිවක් නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වලකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිට ම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුය ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ස කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණ සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැතම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (II) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියක හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස මණ්ඩලය විසින් ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා උපදේශන සේවා වෙනුවෙන් සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක මුදලක් වැය කරමින් 2019 ජනවාරි 30 වැනි දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමක් ඇති කර ගෙන ඇත. ඉදිකිරීම් සංවර්ධන අදියර අවසන් කර 2021 ඔක්තෝබර් 27 දින උපදේශන බිල්පතෙන් සියයට 65 ක් අය කරන ලදී. කෙසේ වුවද, උපදේශන සේවාවල ඉතිරි වැඩ අදියර හෝ පරිශ්‍රයේ යෝජිත වැඩිදියුණු කිරීම් විගණන දිනය වූ 2023 මැයි 25 වන විටත් අවසන් කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දක්වා රු. 20,158,000 ක් මේ සඳහා වැය කරන ලදී. සවිස්තරාත්මක මෘදුකාංග තාක්ෂණික ලේඛන (DSTD), පරීක්ෂණ සැලැස්ම සකස් කිරීම, පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) නිර්ණායක ලේඛනය සකස් කිරීම සහ MIS හි මූලික නොවන මොඩියුලවලට අදාළ විධිමත් අනුමත කිරීම් වැනි කාර්යයන් පමණක් සම්පූර්ණ කර ඇත. කෙසේ වුවද, පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන්, අපේක්ෂිත කාර්ය සමාලෝචන අරමුණ සඳහා එය භාවිතා කිරීමට 2023 මැයි මස අවසානය දක්වා ද නොහැකි වී තිබුණි.

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(I) 2022 දෙසැම්බර් 31 වැනි දිනට මණ්ඩලයේ පුරප්පාඩු 17ක් පැවතුණි. එයින් පුරප්පාඩු 15 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් බලපෑ හැකි විධායක මට්ටමේ පුර්ප්පාඩු විය.

(II) අධ්‍යක්ෂ ජනරාල් තනතුර කොන්ත්‍රාත් පදනම මත ලබා දී තිබුණි. එබැවින් ස්ථිර අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු නොමැතිවීම මණ්ඩලයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට බාධාවක් වනු ඇත.

(III) අනුමත සේවක සංඛ්‍යාව තුළ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරක් පැවතියද, එය මණ්ඩලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණි.

(IV) සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව 2023 මැයි මස අවසානය දක්වා ලැබී නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්යසාධනය

1995 අංක 15 දරන පනතට අනුව, අස්තිත්ව 1671 ක් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBEs) ලෙස හඳුනා ගන්නා ලදී. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2021 සහ 2022 වර්ෂ තුළ සිදු කිරීමට සැලසුම් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන 5550 ක් අතරින් අනුපිළිවෙළින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 552 සහ 541 ක සමාලෝචන සම්පූර්ණ කර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල සැලසුම් කළ හා සත්‍ය වශයෙන් සිදු කළ සමාලෝචන අඩුවීමට හේතුව මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය අඛණ්ඩව අඩුවීම බව නිරීක්ෂණය වේ.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2022 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

2023 වර්ෂයේ ජූලි 14 දිනැති විගණන වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණ	කළමනාකාරිත්වය මගින් ලබා දෙන ලද පිළිතුරු
අ) මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා උපදේශන සේවාවක් සැපයීම සඳහා මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) සමඟ 2019 ජනවාරි 30 දින ගිවිසුමකට එළඹ ඇති අතර, ඒ සඳහා මුළු ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක මුදලක් වැය කර ඇත. ඉදිකිරීම් සංවර්ධන අදියර අවසන් කරන ලද අතර උපදේශන බිලෙන් සියයට 65ක් 2021 ඔක්තෝබර් 27 දින අය කරන ලදී. කෙසේ වුවද, විගණනය අවසන් වූ දිනය වන 2023 මැයි 25 දින දක්වාත් පරිශ්‍රයේ යෝජිත වැඩිදියුණු කිරීම් සම්බන්ධ උපදේශන කටයුතුවල ඉතිරි වැඩ අදියර අවසන් කර නොමැත.	සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2019 වසරේ දී ලංසු කැඳවන ලදී. කෙසේ වුවද, ලේඛනවල අඩුපාඩු හේතුවෙන් ඉදිරිපත් කළ ලංසු තුනම ප්‍රතික්ෂේප වූ අතර ජාතික අයවැය චක්‍රලේඛ 3/2019 සහ 7/2019 සමඟ කියවිය යුතු ජාතික අයවැය චක්‍රලේඛ 5/2019 (3 ඡේදය) මගින් 2019 දී අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වියදම් කප්පාදු කිරීම හේතුවෙන් අභ්‍යන්තර ඉදිකිරීම් ක්‍රියාවලියේ ප්‍රගතිය තවදුරටත් ප්‍රමාද විය. 2019 වර්ෂයේ දී, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වැඩ අදියරවලින් 70% ක් සම්පූර්ණ කර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදු කරන ලදී. 2020 අග භාගයේදී අභ්‍යන්තර සැලසුම් කටයුතු නැවත ආරම්භ කරන විට, 2021 වර්ෂයේ දී ජාතික අයවැය චක්‍රලේඛ 2/2021 සහ 3/2021 (4.1 ඡේදය) සහ 2022 වර්ෂයේ දී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 4/2022 (2.10.1 ඡේදය) මගින් රජය මගින් ප්‍රාග්ධන වියදම් කප්පාදු කිරීම හේතුවෙන් පරිශ්‍රය සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේ සිට දෙවන වරටත් වැඩ නවතා දැමීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කටයුතු කරන ලදී. රජය විසින් ප්‍රාග්ධන වියදම් සීමා කිරීම අද දක්වාම අදාළ වන බැවින්, නව කාර්ය මණ්ඩලයට මෙම ප්‍රදේශය භාවිතයට ගත හැකි වන පරිදි අභ්‍යන්තර කටයුතු අවසන් කිරීම අවශ්‍ය වීම හේතුවෙන්, 2025 දී වැඩ නැවත ආරම්භ කිරීමට SLAASMB අපේක්ෂා කරයි.
ආ) මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දක්වා රු. 20,158,000 ක් දැරීමට සිදු විය. එය සම්පූර්ණ කර තිබුණේ සවිස්තරාත්මක මෘදුකාංග තාක්ෂණික ලේඛනගත කිරීම (DSTD) , පරීක්ෂණ සැලැස්ම සකස් කිරීම, පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) නිර්ණායක ලේඛනය සකස් කිරීම සහ MIS හි මූලික නොවන මොඩියුලවලට අදාළව අත්සන් කිරීම ආදිය පමණි. කෙසේ වුවද, පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන්, එය 2023 මැයි මස අවසානය දක්වා ද, එමඟින් අපේක්ෂිත අරමුණ වූ කාර්යය සමාලෝචනය කිරීම සඳහා භාවිතා කළ නොහැකි විය.	ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය (SLAASMB) විසින් 2021 ඔක්තෝම්බර් මාසයේදී මෘදුකාංග සංවර්ධකයා වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), උපදේශකයින්, පද්ධතිය සඳහා ඔවුන්ගේ Lanka Government Cloud (LGC 2.0) හි නොමිලේ ධාරකත්වය ලබා දීමට එකඟ වී ඇත. කෙසේ වුවද, අත්හදා බැලීමේ පද්ධතිය පරීක්ෂා කිරීම සඳහා ධාරකත්වය ලබා ගැනීම අවශ්‍ය වූ අවස්ථාවේ, ධාරක පහසුකම ලබා දීමට නොහැකි බව ICTA විසින් දැනුම් දෙන ලදී. අනෙකුත් සත්කාරක සේවා සපයන්නන්ගේ මිල අධික වූ බැවින්, SLAASMB වෙත විකල්ප විසඳුමක් නොතිබුණු අතර මාස 3ක කාලයකට පසුව, ඉල්ලුම් කරන ලද LGC 2.0 වේදිකාව සැපයීමට ෂක්ඕ එකඟ විය. ප්‍රමාද වූ එම කාලසීමාව තුළ, මෘදුකාංග සංවර්ධකයා විසින් SLAASMB ව්‍යාපෘතියට වෙන් කරන ලද කාර්ය මණ්ඩලය වෙනත් ව්‍යාපෘති සඳහා යොදවා ඇති අතර ICTA වෙතින් බධක පහසුකම ලැබීමෙන් පසු එම කාර්ය මණ්ඩලය SLAASMB හි MIS ව්‍යාපෘතියට නැවත යොදවන ලදී. මීට අමතරව, සංවර්ධකයා විසින් සපයන ලද පැහැදිලි කිරීම්වලට අනුව, SLAASMB හි MIS හි ඇති සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය හේතුවෙන්, කාලසටහන RFP තුළ මුලින් ප්‍රක්ෂේපණය කරන ලද කාලය ඉක්මවා යෑම සිදු විය. ව්‍යාපෘතියට අදාළ කටයුතු පළමු අදියර තුන දක්වා අවසන් කර ඇති අතර ගෙවීම් කාලසටහනේ දක්වා ඇති පරිදි SLAASMB විසින් පිරිවැයෙන් 50%ක් ගෙවා ඇත. මේ වන විට MIS සහ පරිශීලක (කාර්ය මණ්ඩලය) පුහුණුව සංවර්ධනය කර අවසන් කර ඇති අතර පද්ධතිය 2023 සැප්තැම්බර් 1 වන විට සජීවීකරණය කිරීමට අපේක්ෂා කෙරේ.

2022 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

2023 වර්ෂයේ ජූලි 14 දිනැති විගණන වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණ	කළමනාකාරිත්වය මගින් ලබා දෙන ලද පිළිතුරු
ඇ) මානව සම්පත් කළමනාකරණය ස) 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩු 17ක් තිබුණි. එයින් පුරප්පාඩු 15ක් විධායක මට්ටමේ පුරප්පාඩු වූ අතර එම පුරප්පාඩු පැවතීම මගින් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ට බලපෑමක් සිදු වේ.	වෘත්තීය කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා තබා ගැනීම සඳහා විශේෂ වැටුප් පරිමාණයක් ඇති කිරීම සඳහා 2021 ජූනි 21 දින SLAASMB වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. එවැනි අනුමත වැටුප් පරිමාණ ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) එකඟත්වය ලබා ගැනීමට නියමිත බැවින්, SLAASMB හට මෙම පුරප්පාඩු පිරවීම සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි විය. එසේ වුවද, වැටුප් සම්බන්ධ මෙම ගැටළුව නිරාකරණය වීමෙන් අනතුරුව, කාර්ය මණ්ඩලය බඳවා ගනු ලැබේ.
ii) අධ්‍යක්ෂ ජනරාල් (DG) තනතුර කොන්ත්‍රාත් පදනම මත පැවතුණි. එබැවින් ස්ථිර අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු නොමැතිවීම මණ්ඩලයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට බාධාවක් වනු ඇත.	2007 සහ 2009 දී අධ්‍යක්ෂ ජනරාල් (DG) කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී. කෙසේ වුවද, කාර්ය මණ්ඩල වැටුප් සම්බන්ධ ගැටළු නිරාකරණය වීමත් සමඟම අධ්‍යක්ෂ ජනරාල් (DG) ස්ථිර සේවකයෙකු වශයෙන් බඳවා ගනු ඇත.
iii) අනුමත කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරක් තිබුණද, එය මණ්ඩලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පවතී. iv) සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව 2023 මැයි මාසය අවසන් වනතුරුත් ලැබී නොමැත.	සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර අනුමත කර ඇත්තේ 2018 ජූනි 5 දින අනුමත වූ සේවක සංඛ්‍යාව තුළ මිස මණ්ඩලය ආරම්භයේ සිට නොවේ. කෙසේ වුවද, සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික (ADT) සහ සහකාර අධ්‍යක්ෂ (AD) (නීති) යන තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමට නියමිත බැවින්, පුරප්පාඩුව පිරවීමට නොහැකි විය. සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික (ADT) සහ සහකාර අධ්‍යක්ෂ (AD) (නීති) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි (SoRs) අනුමත කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා සිදු කර නොමැති වුවද, SLAASMB විසින් සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික (ADT) සහ සහකාර අධ්‍යක්ෂ (AD) (නීති) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි (SoRs) අනුමත කිරීම පිළිබඳව අඛණ්ඩව පසු විපරම් කටයුතු සිදු කර ඇත.
ඈ) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්යසාධනය 1995 අංක 15 දරන පනතට අනුව, ආයතන 1,671 නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBEs) ලෙස හඳුනා ගන්නා ලදී. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2021 සහ 2022 වර්ෂ තුළ අනුපිළිවෙළින් සැලසුම් කළ මූල්‍ය ප්‍රකාශන 550 ක සමාලෝචනවලට සාපේක්ෂව, මූල්‍ය ප්‍රකාශන කට්ටල 552 සහ 541 ක සමාලෝචන කටයුතු සම්පූර්ණ කර තිබුණි. සැලසුම් කළ සහ තථ්‍ය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල පිරිහීමට හේතුව මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය අඛණ්ඩව අඩුවීම බව නිරීක්ෂණය වේ.	වාර්ෂිකව SLAASMB විසින් සිදු කළ යුතු මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාව මණ්ඩලය විසින් තීරණය කරයි. ලබා ගත හැකි සම්පත් සමඟ ප්‍රශස්ත මට්ටමක් මත පදනම්ව මෙම ඉලක්ක සකසා ඇත. එනම් කාර්ය මණ්ඩලය පැවතීම. විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි, සැලසුම් කළ සමාලෝචන සංඛ්‍යාව සාක්ෂාත් කර නොගැනීමට ප්‍රධාන හේතුව වන්නේ කාර්ය මණ්ඩල පිරිවැටුම හේතුවෙන් සමාලෝචන සිදුකිරීමට යොදවා ගත යුතු කාර්ය මණ්ඩල සංඛ්‍යාව අඩුවීම සහ වේතන ගැටළු හේතුවෙන් නව කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමට අපහසු වීමය.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2022 දෙසැම්බර් 31 දිනට රු.	2021 දෙසැම්බර් 31 දිනට රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	3	**29,969,068**	34,850,298
අස්පෘශ්‍ය වත්කම්	4	**20,158,000**	5,086,000
තැන්පතු	5	**6,979,736**	6,979,736
නිශ්චිත ප්‍රතිලාභ වත්කම්	10	**8,893,601**	2,422,346
		66,000,405	49,338,380
ජංගම වත්කම්			
තොග	6	**806,108**	774,637
ලැබිය යුතු ගිණුම්	7	**3,075,783**	2,466,515
මුදල් සහ මුදල් හා සමාන දෑ	8	**3,265,940**	13,452,909
		7,147,831	16,694,061
මුළු වත්කම්		**73,148,236**	66,032,441
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන	9	**66,000,405**	49,338,380
		66,000,405	49,338,380
ජංගම වගකීම්			
විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන	11	**3,076,338**	13,304,506
ගෙවිය යුතු ගිණුම්	12	**4,071,493**	3,389,555
		7,147,831	16,694,061
මුළු වගකීම්		**73,148,236**	66,032,441

53 වන පිටුවේ සිට 59 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ වගකීමක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති

සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(මූල්‍ය හා පරිපාලන)

2023 ජනවාරි 31

මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2022 රු.	2021 රු.
ආදායම			
රාජ්‍ය ප්‍රදාන	13	**81,015,260**	75,236,691
අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයට නිදහස් කළ ප්‍රදාන		**4,000,000**	4,000,000
		77,015,260	71,236,691
මෙහෙයුම් වියදම්			
මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා		**(1,031,732)**	(1,579,500)
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	14	**(151,700)**	(214,000)
කාර්ය මණ්ඩල පිරිවැය	15	**(39,456,582)**	(36,828,568)
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		**(183,350)**	(235,900)
පුවත්පත් නිවේදන		**(198,134)**	(600,210)
කුලි හා ගොඩනැගිලි සේවා ගාස්තු		**(13,450,704)**	(11,529,825)
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	3	**(5,528,087)**	(5,513,082)
විදුලිය		**(988,018)**	(871,114)
සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු		**(661,500)**	(503,500)
අන්තර්ජාතික සාමාජිකත්වයන්		**(1,797,493)**	(1,954,819)
පොත් හා වාර සඟරා		**(890,488)**	(1,201,016)
පුහුණුව හා සංවර්ධනය		**(1,202,492)**	(2,818,139)
බලපත්‍ර හා රක්ෂණ		**(928,494)**	(934,425)
ලිපිද්‍රව්‍ය		**(1,302,366)**	(797,472)
වෙනත් පරිපාලන වියදම්	16	**(9,244,120)**	(5,655,120)
-		**-**	-
වෙනත් විස්තීර්ණ ආදායම්			
නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය / (පාඩුව)		**4,769,117**	3,234,677
නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාළ රජයේ ප්‍රදාන		**(4,769,117)**	(3,234,677)
		-	-
වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය)		**-**	-

53 වන පිටුවේ සිට 59 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල (රු)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	-
වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	-
වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය)	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	-

53 වන පිටුවේ සිට 59 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය)		-	-
ගැලපීම්:			
වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන		**82,680,000**	83,683,350
මුළු විස්තිර්ණ ආදායම් වලට මාරුකළ විලම්භිත රාජ්‍ය ප්‍රදාන	13	**(76,246,143)**	(72,002,014)
ක්ෂය වීම්	3	**5,528,087**	5,513,082
කාර්යාල උපකරණ ඉවත් කිරීමේ දී වූ අලාභය			1
පාරිතෝෂික අරමුදල් ආයෝජනයෙන් ලද පොළිය		**(744,113)**	(289,923)
නිශ්චිත ප්‍රතිලාභ වත්කම්	15.1	**(4,221,255)**	(2,033,794)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර වියදමට වැඩි ආදායම / (ආදායමට වැඩි වියදම)		**6,996,576**	14,870,702
තොග (වැඩිවීම) / අඩුවීම		**(31,472)**	9,174
ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම		**(609,268)**	(184,200)
ගෙවිය යුතු මුදල් වැඩිවීම / (අඩුවීම)		**681,939**	130,027
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**7,037,775**	14,825,703
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම		**(646,857)**	(1,970,351)
මෘදුකාංග සංවර්ධනය සඳහා කරන ලද ගෙවීම්		**(15,072,000)**	(5,086,000)
පාරිතෝෂික අරමුදල් ආයෝජනය		**(2,250,000)**	(3,075,000)
පාරිතෝෂික අරමුදල් / ආරක්ෂිත සේප්පුව සම්බන්ධ ආයෝජන වලින් ලද පොළිය		**744,113**	289,923
ශුද්ධ මුදල් ප්‍රවාහ		**(10,186,969)**	4,984,275
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		-	-
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**(10,186,969)**	4,984,275
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**13,452,909**	8,468,634
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	8	**3,265,940**	13,452,909

53 වන පිටුවේ සිට 59 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

01 ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2023 ජනවාරි 31 දින එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයක් මගින් නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ කාර්යය වන්නේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන යටතේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූල වීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමයි.

මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 13 දෙනෙක්, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 2ක් සහ තාවකාලික පදනම මත 1 සේවකයකු සේවයේ යොදවා තිබුණි. (2021 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 13 දෙනෙකු, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 3 දෙනෙකු සහ 1 තාවකාලික සේවකයෙකු සේවයේ යොදවා තිබුණි.)

02 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වෛතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත සකස්කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති කාල සීමාව පුරාවට අඛණ්ඩව යොදාගෙන ඇත.

වාර්තා කිරීමේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසුව සිදුවන සියලුම වැදගත් සිදුවීම් සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශන වල සුදුසු ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයකිරීම් අඩු කළ පිරිවැයට දක්වනු ලැබේ. ක්ෂයකිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වනු ලැබේ.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය පුරා සරල මාර්ග පදනම මත කාර්යසාධනය පහත පරිදි වේ.

වත්කම	ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය
මෝටර් වාහන	අවුරුදු 15 යි
කාර්යාල උපකරණ	අවුරුදු 4-25
ගෘහභාණ්ඩ, සවිකෘත සහ උපාංග	අවුරුදු 6-25
පොත් හා ප්‍රකාශන	අවුරුදු 3 යි

භාවිතා කරන කාලසීමාව මත පදනම්ව මිලදී ගත් වර්ෂයේ සහ විකුණුම් වර්ෂයේ ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. මිලදී ගත් මාසයේ සම්පූර්ණ ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විකුණුම් මාසයේ කිසිදු ක්ෂයකිරීමක් සඳහා ප්‍රතිපාදන සලසනු නොලැබේ.

පිරිවැය රු.7,500/- නොඉක්මවන වටිනාකමකට මිල දී ගත් පොත් සහ ප්‍රකාශන හැර අනෙකුත් අයිතම, පිරිවැය රු.1000/- නොඉක්මවන සියලුම ගිණුම් ප්‍රමිති සහ විගණන ප්‍රමිති සහ අනෙකුත් ප්‍රකාශන මිල දී ගත් වර්ෂයේ වියදම් ලෙස දක්වනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් වලින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි නම් සහ එහි පිරිවැය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් SLPSAS 20- අස්පෘශ්‍ය වත්කම්වලට අනුකූලව විශ්වසනීයව මැනිය හැකි නම් හඳුනාගනු ලැබේ. සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි (Impairments) අඩු කළ පිරිවැයට මනිනු ලැබේ.

තොග

තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් අතරින් අඩු වටිනාකමට අගය කරනු ලැබේ. තොග වල පිරිවැය පළමු - ගැනුම්, පළමු-නිකුතු (FIFO) පදනම භාවිතා කිරීමෙන් මනිනු ලැබේ.

ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් උපලබ්ධි වීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයට දක්වා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී බොල් සහ අඩමාණ ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කිරීම් කරනු ලැබේ.

මුදල් සහ මුදල් හා සමාන දෑ

අතැති මුදල් සහ බැංකුවල ඇති මුදල් සහ කෙටි කාලීන තැන්පතු, පිරිවැයට ගණනය කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ අතේ ඇති මුදල් සහ බැංකු තැන්පතු, වලින් බැංකු අයිරාව අඩු කර පෙන්වනු ලැබේ.

ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතු ගිණුම් සඳහා වන වගකීම්, ගෙවීමට අපේක්ෂිත මුදල් සහ හා මුදල් හා සමාන දෑ ප්‍රමාණය අනුව ගණනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

02 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (Continued)

නිශ්චිත ප්‍රතිලාභ පිරිවැය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අතර, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම නියෝජනය කරයි. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ සියලුම ආයුගණක ලාභ සහ අලාභ වහාම හඳුනා ගැනේ.

රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන අදාළ වියදම් හඳුනාගෙන ඇති කාලසීමාව තුළ ආදායම ලෙස හඳුනා ගැනේ.

පසුකාලීනව වියදම් කරනු ලබන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිත කරන රාජ්‍ය ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස හඳුනාගැනේ. මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම්වලින් වගකීම් අඩු කර නියෝජනය වන රාජ්‍ය ප්‍රදාන (ලැබෙන ප්‍රදාන නිසා ඇතිවන වගකීම් හැර) වගකීම් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3. දේපළ, පිරියත සහ උපකරණ

දිනට	මෝටර් වාහන		කාර්යාල උපකරණ		ලී බඩු, හා සවිකිරීම්		පුස්තකාල පොත්		කෙරිගෙන යන වැඩ		එකතුව	
	31-දෙසැ-22 රු.	31-දෙසැ-21 රු.	31-දෙසැ-22 රු.	31-දෙසැ-21 රු.	31-දෙසැ-22 රු.	31-දෙසැ-21 රු.	31-දෙසැ-22 රු.	31-දෙසැ-21 රු.	31-දෙසැ-22 රු.	31-දෙසැ-21 රු.	31-දෙසැ-22 රු.	31-දෙසැ-21 රු.
පිරිවැය												
වර්ෂය ආරම්භයේ ශේෂය	**51,160,000**	51,160,000	**12,252,537**	11,456,057	**12,402,537**	12,217,271	**3,223,399**	3,198,399	**1,937,904**	-	**80,976,377**	78,031,727
එකතු කිරීම්	**-**	-	**337,657**	1,191,480	**308,000**	185,266	**1,200**	25,000	**-**	568,605	**646,857**	1,970,351
ඉවත් කිරීම්	**-**	-	**-**	(395,000)	**-**	-	**-**	-	**-**	-		(395,000)
මාරු කිරීම්	**-**	-	**296,850**	-	**-**			-	**(296,850)**	1,369,299		1,369,299
වර්ෂය අවසානයේ ශේෂය	**51,160,000**	51,160,000	**12,887,044**	12,252,537	**12,710,537**	12,402,537	**3,224,599**	3,223,399	**1,641,054**	1,937,904	**81,623,234**	80,976,377
සමුච්චිත ක්ෂය												
වර්ෂය ආරම්භයේ ශේෂය	**24,689,333**	21,278,666	**8,396,025**	7,437,400	**9,835,157**	9,094,004	**3,205,564**	3,197,926	**-**	-	**46,126,079**	41,007,996
වර්ෂය සඳහා ක්ෂයකිරීම්	**3,410,667**	3,410,667	**1,295,711**	1,353,624	**813,210**	741,153	**8,499**	7,638	**-**	-	**5,528,087**	5,513,082
ඉවත් කිරීම් මත ක්ෂය	**-**	-	**-**	(394,999)	**-**	-	**-**	-	**-**	-		**(394,999)**
මාරු කිරීම්												
වර්ෂය අවසාන ශේෂය	**28,100,000**	24,689,333	**9,691,736**	8,396,025	**10,648,367**	9,835,157	**3,214,063**	3,205,564	**-**	-	**51,654,166**	46,126,079
වර්ෂය අවසානයේ ලියා අඩු කළ අගය	**23,060,000**	26,470,667	**3,195,308**	3,856,512	**2,062,170**	2,567,380	**10,536**	17,835	**1,641,054**	1,937,904	**29,969,068**	34,850,298

කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩවලට 2019 සහ 2021 කාලය තුළ කාර්යාල අවකාශයට අදාළව සිදු කරන ලද අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශක වෙත ගෙවන ලද ගාස්තු ඇතුළත් වේ. රජයේ ප්‍රාග්ධන වියදම් කපා හැරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය කල් දමා ඇති අතර එය 2024 වර්ෂයේ දී නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022 දෙසැ 31 රු.	2021 දෙසැ 31 රු.
4	**අස්පෘශ්‍ය වත්කම්** (මෘදුකාංග - කෙරීගෙන යන වැඩ)		
	වර්ෂ ආරම්භයේ ශේෂය	**5,086,000**	-
	වර්ෂය තුළ ගෙවීම්	**15,072,000**	5,086,000
	වර්ෂ අවසානයේ ශේෂය	**20,158,000**	5,086,000
5	**තැන්පතු (ජංගම නොවන)**		
	කුලී තැන්පතු	**6,879,736**	6,879,736
	ආරක්ෂක සේප්පු තැන්පතු	**100,000**	100,000
		6,979,736	6,979,736
6	**තොග**		
	ලිපිද්‍රව්‍ය	**806,108**	774,637
7	**ලැබිය යුතු ගිණුම්**		
	ඉදිරියට කළ ගෙවීම්	**3,070,783**	2,461,515
	තැන්පතු	**5,000**	5,000
		3,075,783	2,466,515
8	**මුදල් සහ මුදල් හා සමාන දෑ**		
	අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	**3,265,940**	13,452,909
		3,265,940	13,452,909
9	**විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන)**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**49,338,380**	41,317,019
	ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු හා භාවිත කළ ප්‍රදාන	**15,718,857**	7,056,351
	ලැබිය යුතු ගිණුම් වලින් මාරු කරන ලද ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු හා භාවිත කළ ප්‍රදාන	-	1,369,299
	ලැබුණු ප්‍රදාන සහ පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කළ ප්‍රදාන	**2,250,000**	3,075,000
	වර්ෂය සඳහා ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය වියදම්	**(5,528,087)**	(5,513,082)
	පාරිතෝෂික අරමුදලෙන් ලැබුණු පොළිය	**744,113**	289,923
	කාර්යාල උපකරණ අපහරණය මත සිදු වූ අලාභය	-	(1)
	වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගාස්තුව	**3,477,142**	1,743,871
	වර්ෂය අවසානයේ ශේෂය	**66,000,405**	49,338,380
	නියෝජනය වන්නේ:		
	දේපළ, පිරියත සහ උපකරණ	**29,969,068**	34,850,298
	අස්පෘශ්‍ය වත්කම්	**20,158,000**	5,086,000
	තැන්පතු (ජංගම නොවන)	**6,979,736**	6,979,736
	(පාරිතෝෂික වෙන්කිරීම) / පාරිතෝෂික අරමුදලේ අතිරික්තය	**8,893,601**	2,422,346
	වර්ෂය අවසානයේ ශේෂය	**66,000,405**	49,338,380

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022 දෙසැ 31 රු.	2021 දෙසැ 31 රු.
10	**නිශ්චිත ප්‍රතිලාභ (වත්කම්) / වගකීම්**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**6,874,244**	9,295,495
	වර්ෂය සඳහා ප්‍රතිපාදන	**179,380**	563,412
	වර්ෂය තුළ ලැබුණු පොළිය	**1,112,595**	927,394
	ආයුගණක (ලාභ) / පාඩු	**(4,769,117)**	(3,234,677)
		3,397,102	7,551,624
	වර්ෂය තුළ ගෙවීම්	**(816,492)**	(677,380)
		2,580,610	6,874,244
	පාරිතෝෂික අරමුදල (සටහන් 10.1)	**(11,474,211)**	(9,296,590)
	වර්ෂය අවසානයේ ශේෂය	**(8,893,601)**	(2,422,346)
	ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත		
	අපේක්ෂිත වැටුප් වැඩිවීම	**2%**	10%
	වට්ටම් / පොළී අනුපාතය	**18%**	10.90%
	පිරිවැටුම් අනුපාතය	**9%**	9%
	පාරිතෝෂික සඳහා වගකීම ආංශිකව බාහිර අරමුදල් මගින් සම්පාදනය කර ඇත		
10.1	**පාරිතෝෂික අරමුදල**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**9,296,590**	6,609,047
	වර්ෂය තුළ සිදු කරන ලද ආයෝජන	**2,250,000**	3,075,000
	වර්ෂය තුළ ලැබුණු පොළිය	**744,113**	289,923
	වර්ෂය තුළ කරන ලද ගෙවීම්	**(816,492)**	(677,380)
	වර්ෂය අවසානයේ ශේෂය	**11,474,211**	9,296,590
11	**විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම)**		
	වර්ෂය ආරම්භයේ ශේෂය	**13,304,506**	9,644,531
	තොග සහ ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්)	**640,739**	(1,194,273)
	මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම් / (අඩුවීම්)	**(10,186,969)**	4,984,275
	ගෙවිය යුතු ගිණුම්වල (වැඩිවීම) / අඩුවීම්	**(681,938)**	(130,027)
	වර්ෂය අවසානයේ ශේෂය	**3,076,338**	13,304,506
	නියෝජනය වන්නේ:		
	තොග	**806,108**	774,637
	ලැබිය යුතු ගිණුම්	**3,075,783**	2,466,515
	මුදල් සහ මුදල් හා සමාන දෑ	**3,265,940**	13,452,909
	අඩු කළා: ගෙවිය යුතු ගිණුම්	**(4,071,493)**	(3,389,555)
	වර්ෂය අවසානයේ ශේෂය	**3,076,338**	13,304,506
12	**ගෙවිය යුතු ගිණුම්**		
	විගණකවරුන්ගේ පාරිශ්‍රමික	**214,000**	428,300
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන	**1,000,000**	1,000,000
	සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු	**80,000**	154,500
	ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා	**624,000**	682,500
	උපචිත අභ්‍යන්තර විගණන ගාස්තු	**222,525**	175,000
	උපචිත වාර්ෂික වාර්තා වියදම්	**1,380,703**	550,000
	වෙනත් ගෙවිය යුතු දෑ	**550,265**	399,255
		4,071,493	3,389,555

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022 දෙසැ 31 රු.	2021 දෙසැ 31 රු.
13	**රාජ්‍ය ප්‍රදාන**		
	වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන	**82,680,000**	83,683,350
	ලැබුණු ප්‍රදාන සහ පාරිතෝෂික අරමුදලේ ආයෝජනය කළ ප්‍රදාන	**(2,250,000)**	(3,075,000)
	ප්‍රාග්ධන වියදම් සඳහා වැය කළ ප්‍රදාන	**(15,718,857)**	(7,056,351)
	ලැබුණු ප්‍රදාන සහ ලැබිය යුතු ගිණුම්වලින් මාරු කරන ලද ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීමට වැය කළ ප්‍රදාන	**-**	(1,369,299)
	ශුද්ධ ජංගම වත්කම් මූල්‍යකරණය සඳහා වැය කළ ප්‍රදාන	**10,228,168**	(3,659,975)
	වර්ෂය සඳහා ක්ෂය වියදම් සහ ක්‍රමක්ෂ වියදම්	**5,528,087**	5,513,082
	පාරිතෝෂික අරමුදලින් ලැබුණු පොළිය	**(744,113)**	(289,923)
	කාර්යාල උපකරණ ඉවත් කිරීමෙන් සිදු වූ අලාභය	**-**	1
	වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම්	**1,291,975**	1,490,806
		81,015,260	75,236,691
	මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන ප්‍රදාන වෙනත් විස්තීර්ණ ආදායම් තුළ දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යළි ගණනය කිරීමට අදාළ වූ ප්‍රදාන	**(4,769,117)**	(3,234,677)
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා ඇති මුළු විස්තීර්ණ ආදායම්වලට මාරු කරන ලද මුළු ප්‍රදාන	**76,246,143**	72,002,014
14	**විගණකවරුන්ගේ පාරිශ්‍රමික**		
	ජංගම වර්ෂයේ වියදම්	**214,000**	240,100
	පසුගිය වසරේ (අධි) / ඌන වෙන් කිරීම්	**(62,300)**	(26,100)
		151,700	214,000
15	**කාර්ය මණ්ඩල පිරිවැය**		
	කාර්ය මණ්ඩල පාරිශ්‍රමික	**23,859,170**	20,558,150
	සේවක අර්ථසාධක අරමුදල්	**2,281,697**	2,279,064
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල්	**570,424**	569,767
	නිශ්චිත ප්‍රතිලාභ වගකීම් (සටහන 15.1)	**547,862**	1,200,883
	වෙනත් බාහිරින් ලබා ගත් සේවා සඳහා ගෙවීම්	**1,354,736**	1,213,090
	කාර්ය මණ්ඩල දිරි දීමනා	**8,180,005**	8,352,500
	කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණය	**488,963**	529,060
	කාර්ය මණ්ඩල සුබසාධනය	**978,692**	646,937
	වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	**1,195,033**	1,479,115
		39,456,582	36,828,568
15.1	**නිශ්චිත ප්‍රතිලාභ වගකීම්**		
	වර්ෂය සඳහා ගාස්තු	**179,380**	563,412
	වර්ෂය සඳහා ශුද්ධ පොළිය	**368,482**	637,471
		547,862	1,200,883
	වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හෙළිදරව් කළ ආයුෂනක ලාභ / අලාභ	**(4,769,117)**	(3,234,677)
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කළ නිශ්චිත ප්‍රතිලාභ වගකීම්	**(4,221,255)**	(2,033,794)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022 දෙසැ 31 රු.	2021 දෙසැ 31 රු.
16	**වෙනත් පරිපාලන වියදම්**		
	වාර්ෂික වාර්තා	**2,363,027**	744,535
	පරිගණක නඩත්තු වියදම්	**160,883**	191,883
	උපකරණ නඩත්තු වියදම්	**657,447**	454,247
	සන්නිවේදන වියදම්	**1,462,275**	1,129,872
	වාහන නඩත්තු වියදම්	**2,299,742**	1,043,901
	වාහන ගාල් කිරීමේ වියදම්	**342,000**	342,300
	ආපසු අය කළ නොහැකි තැන්පතු කපා හැරීම්	**-**	25,000
	නෛතික හා වෘත්තීය ගාස්තු	**175,500**	379,576
	අභ්‍යන්තර විගණන ගාස්තු	**463,370**	350,000
	ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් සහ කාර්යාල උපකරණ රක්ෂණය	**140,590**	126,682
	නියාමන ප්‍රකාශන	**517,669**	171,940
	බැංකු ගාස්තු	**150,584**	17,985
	ගමන් වියදම්	**58,565**	188,140
	කාර්යාල වියදම්	**452,468**	489,059
		9,244,120	5,655,120

17. ප්‍රාග්ධන වගකීම් වලට බැඳීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් 2021 ඔක්තෝබර් මාසයේ දී මෘදුකාංග සංවර්ධකයින්ට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරමින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. තවද, රජයේ අවශ්‍යතාවයට අනුව, කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතියේ උපදේශකයින් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) පත් කර ඇත.

මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ මැද භාගය වන විට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද, රජයේ ක්ලවුඩ් දත්ත පද්ධතියෙහි (Local Government Cloud) සත්කාරක විධිවිධාන තහවුරු කිරීම සම්බන්ධයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) ප්‍රමාදය හේතුවෙන්, ව්‍යාපෘතිය අවසන් කිරීම 2023 වර්ෂයේ 1 වන කාර්තුව දක්වා කල් දමන ලදී.

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට එකී MIS ව්‍යාපෘතියට අදාළව ගිවිස ගන්නා ලද නමුත් දරනු නොලැබූ ප්‍රාග්ධන බැඳීම රු. 22,692,000/- ක් (2021 දෙසැම්බර් වන විට රු. 37,764,000/- ක්) විය.

18. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

දැඩි කාර්ය මණ්ඩල හිඟය සහ බඳවා ගැනීම් සඳහා රජය පනවා ඇති සීමා හේතුවෙන් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම දුෂ්කර වීම හේතුවෙන්, කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සහ රඳවා ගැනීම සඳහා පුහුණු සැසියක් Wake Up Zone (Pvt) Ltd මගින් රු. 70,000/-ක පිරිවැයකට පවත්වන ලදී. නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු Wake up Zone (Pvt) Ltd. ආයතනය තෝරා ගන්නා ලදී. කෙසේ වුවද, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පී.ආර්.වී.අයි. ගුණරත්න මහතා Wake up Zone (Pvt) Ltd හි අධ්‍යක්ෂවරයෙකි.

19. අසම්භාව්‍ය වගකීම්

2022 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් නොතිබුණි. (2021 දෙසැම්බර් 31 දිනට - කිසිවක් නොතිබිණ.)

20. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍යවන්නාවූ ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනෙන් පසු සිදු වී නොමැත.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ කරනු ලැබූ නියෝග ප්‍රකාර, පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- බලපත්‍රලාභී බැංකු
- රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්
- කල්බදු ව්‍යාපාර කටයුතුවල නිරත වී සිටින සමාගම්
- ණය නිශ්කාෂණ සමාගම්
- මූල්‍ය සමාගම්
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලපත්‍ර ලත් සමාගම්
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර ලත් සමාගම්
- අරමුදල් කළමනාකරණ සමාගම්
- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ලත් සමාගම්
- කොටස් වෙළඳපලේ ලැයිස්තුගත සමාගම්
- වෙනත් සමාගම්

  (අ) රුපියල් මිලියන 500ට වැඩි පිරිවැටුමක් සහිත සමාගම්

  (ආ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100ට වැඩි සමාගම්

  (ඇ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 300ට වැඩි සමාගම්

  (ඈ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100ට වැඩි බැරකම් ඇති සමාගම්

  (ඉ) සේවකයින් 1000ට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුතු සමාගම්

- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුතු රාජ්‍ය සංස්ථා
- ඉහත සඳහන් කුමන හෝ කාණ්ඩයකට අයත් වන ව්‍යාපාර සමූහයක්. මෙහි දී ව්‍යාපාර සමූහය යන්නෙන් අදහස් වන්නේ සමාගම් පනත යටතේ ගිණුම් ඒකාබද්ධ කළ යුතු එක් පාලක සමාගමක් හා එහි පාලිත සමාගම්ය.

ආයතනයේ නම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

නෛතික තත්වය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව
සංස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

සංස්ථාපිත කරන ලද රට

ශ්‍රී ලංකාව

ප්‍රධාන කාර්යාලය

තෙවන මහල,
293, ගාලු පාර, කොළඹ 03
දුරකථන අංකය: 011 2301210 / ෆැක්ස් අංකය: 011 2301211
විද්‍යුත් තැපෑල - slaasmb@sltnet.lk

වෙබ් අඩවිය

www.slaasmb.gov.lk

විගණකවරුන්

බාහිර විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/2, පොල්දූව පාර, බත්තරමුල්ල

අභ්‍යන්තර විගණකවරුන්

ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස්
නො. 100, බ්‍රේබෘක් පෙදෙස, කොළඹ 02

බැංකුකරු

ලංකා බැංකුව

නීති උපදේශකවරු

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12



ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය
3වන මහල, බයිබල් හවුස්, 293, ගාලු පාර, කොළඹ 3, ශ්‍රී ලංකාව.